# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 79 — 1973 සැප්තැම්බර් 28 වැනි සිකුරාදා — 1973.09.28

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1309 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1333 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | 1336 |
| කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


සැලකිය යුතුයි.—ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනතේ කෙටුම්පත 1973 සැප්තැම්බර් 21 දින ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී. (ii) මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලියක් ද පළවේ.

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය

1974 ජනවාරි මස 1 වෙනි දින සිට 1974 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා වූ කාලසීමාව තුළ මන්නාරම, එලිපන්ට්පාස්, සිලාවතුරේ, යාපනය, වෙම්පන්කුණ්ඩු සහ මූලතිව් පිහිටා ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදා කඳවුරුවලට පලාපු දර සැපයීම සඳහා 1973 ඔක්තෝබර් මස 22 වෙනි දින පෙරවරු 10 දක්වා, කොළඹ, බාලදක්ෂ මාවතේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ඉහත සඳහන් සැපයීම් පිණිස නැවත ලබාගත හැකි රු. 75ක මුදලක් (චෙක්පත් භාරගනු නොලැබේ) තැන්පත් කර තිබිය යුතුය. පූර්වෝක්ත සැපයීම් පිළිබඳව ටෙන්ඩර් පත් 1973 ඔක්තෝබර් මස 17 වෙනි දින දහවල් 12 දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය විසින් නිකුත් කරනවා ඇත.

වැඩි විස්තර සඳහා කොළඹ, බාලදක්ෂ මාවතේ පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයෙන් දැනගත හැකිය.

සී. එස්. ආටිගල,
මේජර් ජනරාල්,
යුද්ධ හමුදාධිපති, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව.

1973 සැප්තැම්බර් මස 8 වෙනි දින,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
බාලදක්ෂ මාවත,
තැ. පෙ. 553,
කොළඹ 3.

9–663/1—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

### ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය

1974 ජනවාරි මස 1 වෙනි දින සිට 1974 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා වූ කාලසීමාව තුළ මන්නාරම, එලිපන්ට්පාස්, සිලාවතුරේ, යාපනය, වෙම්පන්කුණ්ඩු සහ මුලතිව් පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා කඳවුරුවලට බැරැක්ක හා ආරෝග්‍යශාලා රෙදිපිළි සහ සෙසු නිලධාරීන්ගේ රෙදිපිළි සේදීම සඳහා 1973 ඔක්තෝබර් මස 22 වෙනි දින පෙරවරු 10 දක්වා, කොළඹ බාලදක්ෂ මාවතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රධාන ගණකාධිකාරි වෙත ඉහත සඳහන් සැපයීම් පිණිස නැවත ලබාගත හැකි රු. 75ක මුදලක් (චෙක්පත් භාරගනු නොලැබේ) තැන්පත් කර තිබිය යුතුය. පූර්වෝක්ත සැපයීම් පිළිබඳව ටෙන්ඩර් පත් 1973 ඔක්තෝබර් මස 17 වෙනි දින දහවල් 12 දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය විසින් නිකුත් කරනු ඇත.

වැඩි විස්තර කොළඹ, බාලදක්ෂ මාවතේ පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයෙන් දැනගත හැකිය.

ඩී. එස්. ආටිගල,
මේජර් ජනරාල්,
යුද්ධ හමුදාධිපති, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව.

1973 සැප්තැම්බර් මස 8 වෙනි දින,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
බාලදක්ෂ මාවත,
තැ. පෙ. 553,
කොළඹ 3.

9–663/2—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

### ජාතික කිරි මණ්ඩලය—පිටිකිරි යෝජනා ක්‍රමය

පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීම

පහත සඳහන් කර ඇති ද්‍රව්‍ය රාගම, වැලිසර ජාතික කිරි මණ්ඩලයේ පිටිකිරි යළි ඇසිරීමේ කර්මාන්ත ශාලාවෙන් මිළදී ගෙන, එම ස්ථානයෙන් ඉවත් කරගෙන යාම පිණිස 1973 ඔක්තෝබර් මස 12 වෙනි දින සවස 2 දක්වා පහත අත්සන් කරන මා විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

විස්තර :—

1. පලුදුවූ රාත්තල් 2 1/2 හිස් පිටිකිරි ටින්.
2. පලුදුවූ රාත්තල් 1 හිස් පිටිකිරි ටින්.
3. වානේ පටි.
4. ලෝහ පටි.

ඉහත සඳහන් භාණ්ඩ රාගම, වැලිසර පිටිකිරි යළි ඇසිරීමේ කර්මාන්ත ශාලාවේදී (කොළඹ මීගමු පාරේ 8 වෙනි සැතපුම් කණුව අසල) සාමාන්‍ය වැඩ කරන වේලාවන් තුළදී පරීක්ෂා කළ හැක.

ආපසු ගෙවනු ලබන රු. 250 ක තැන්පත් මුදලක් තබන අයදුම්කරුවන්ට, රාගම, වැලිසර, පිටිකිරි යළි ඇසිරීමේ කර්මාන්ත ශාලාවේ ගණකාධිකාරි විසින් 1973 ඔක්තෝබර් මස 10 වෙනි දින සවස 2 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර රාගම, වැලිසර පිටිකිරි යළි ඇසිරීමේ කර්මාන්ත ශාලාවේ සම්පාදනාගාර හා වාණිජ කළමනාකරු වෙතින් සාමාන්‍ය වැඩ කරන වේලාවන් තුළදී ලබාගත හැක.

සභාපති,
කිරි මණ්ඩලය.

පිටිකිරි යෝජනා ක්‍රමය,
වැලිසර-රාගම,
1973 අගෝස්තු මස 3 වෙනි දින.

9–706—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

ටෙන්ඩර් පත් කැඳවීම—හානිවූ බඩු විකිණීම සඳහා

පහත සඳහන් හානිවූ බඩු මිලයට ගැනීම සඳහා මුද්‍රා තැබූ ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

ඇස්බැස්ටොස් ෆයිබර් රු. 1008
චිත් සෑදීමට ගන්නා තහඩු
මැද කොටස් 4580
පියන් 33400
හාඩ්බෝඩ් මිට්ස් 1299
ප්ලාස්ටික් වැසිකිලි අසුන් සහ කවර 9 සහ අසුන් කවර 104
තෝ රු. 1514 පෙට්ටි 23
පාඨශාලා හුනු පෙට්ටි 1886 එක් පෙට්ටියක කෑලි 144 බැගින්

ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ කොළඹ 1, ෆ්ලවර් ගොඩනැගිල්ලේ, මුහුදු කළමනාකරුගෙන් ලබාගන්නා පෝරමයන් මගිනි.
1973 ඔක්තෝබර් මස 16 වැනි දින ප. ව. 1.30 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වේ.

කළමනාකරු,
මුහුදු ආරක්ෂක දෙපාර්තමේන්තුව.

9–761—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

### ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය—නැගෙනහිර දිසාව—ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය

චීන වරාය ගුවන්තොටුපොල මහාමාර්ග කොන්ක්‍රිට් කලාලයක් ඇතිකිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රානුසාරයෙන් කැඩූ වර්ග කරන ලද 3/4" කළුගල් කියුබ් 250 ක් සපයා චීන වරායේ ගල් කොරියට භාර දීම සඳහා ටෙන්ඩර් පත් ත්‍රිකුණාමලය ගෝරිස් හිල් මාවත, සහකාර අධ්‍යක්ෂ කාර්යාලයේ, සහකාර අධ්‍යක්ෂ විසින් වර්ෂ 1973 ඔක්තෝබර් මස 16 වැනි අඟහරුවාදා පෙ. ව. 10 වනතෙක් ටෙන්ඩර් භාරගෙන, එම වේලාව ගතවූ වහාම එම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

2. ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති හා ග්‍රාමීය සංවර්ධන සමිති, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, මහමාර්ග දෙපාර්තමේන්තුවේ, ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ හෝ වෙනත් රජයේ සංස්ථාවක හෝ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන්ට ඉහත වූ වැඩ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

3. ටෙන්ඩර් පත්‍ර 1973 ඔක්තෝබර් මස 2 දින හෝ ඊට පෙර ත්‍රිකුණාමලය, ගෝමරන්කඩවල, කන්තලේ හා මූදූර් යන ස්ථානයන්හි පිහිටි විධායක ඉංජිනේරු කාර්යාලයෙකින් රාජකාරි වේලාවලදී ලබා ගත හැක. ටෙන්ඩර් ආකෘති පත්‍රය සඳහා ඉල්ලුම්කිරීමේ අවසරය සනාථ කිරීම සඳහා තමතමන්ගේ ලියාපදිංචි පොත් ඉදිරිපත් කළ යුතු අතරම, ප්‍රථමයෙන් විධායක ඉංජිනේරු හට තමා විසින් හිටුවන වැඩ සහ වටිනාකම පහදා දැක්වෙන ප්‍රකාශනයක් සැපයිය යුතුය. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර විධායක ඉංජිනේරු කාර්යාල රාජකාරි වේලාවලදී ටෙන්ඩර් සඳහා රු. 50 ක මුදලක් තැන්පත් කළ යුතුය. නැතහොත් එම මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම ටෙන්ඩර් සම්බන්ධව වැඩිදුරටත් විස්තර, ත්‍රිකුණාමලය විධායක ඉංජිනේරු කාර්යාලයේ රාජකාරි වේලාවලදී ලබා ගැනීමට පුළුවන.

ආර්. මහදේවන්,
විධායක ඉංජිනේරු, ත්‍රිකුණාමල කොට්ඨාශය.

විධායක ඉංජිනේරු කාර්යාලය,
ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය,
ත්‍රිකුණාමල කොට්ඨාශය,
ත්‍රිකුණාමලය.

9–771—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

### ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය—උතුරු දිසාව

1973 ජූලි මස 20 වැනි සහ 1973 අගෝස්තු 17 වැනි දිනයන් වූ ශ්‍රී ලංකා ගැසට් පත්‍රයෙහි පෙනෙන ලද "තොන්ඩමනාරු හරස් අමුණට ලී ගේට්ටු දෙකක් සැපයීම හා සවිකිරීම යන වැඩ අදාල ටෙන්ඩර් පත්‍ර දෙන අන්තිම දිනය 1973 ඔක්තෝබර් මස 12 වැනි දින තුරු ද, ටෙන්ඩර් සභාපතිතුමා විසින් බාරගන්නා දිනය 1973 ඔක්තෝබර් මස 17 වැනි දින දක්වා දීර්ඝ කර ඇති බව මෙයින් දන්වනු ලැබේ.

ස. තියාගරාජා,
විධායක ඉංජිනේරු තැන,
පේදුරුතුඩුව.

විධායක ඉංජිනේරු කාර්යාලය,
ප්‍රා. සි. ඉ. සං., පේදුරුතුඩුව.

9–749—73.09.28 දින අංක 79 දරන ගැසට් පත්‍රය

---

### ලංකා ගමනාගමන මණ්ඩලය

#### වේරහැර බොරලැස්ගමුවේ තිබෙන අබලි බැටරි, සුන්බුන් ද්‍රව්‍ය හා ගර්හිත යන්ත්‍ර සූත්‍ර කොටස් විකිණීම

වේරහැර, බොරලැස්ගමුවේ, අපහරණ අංගනයේ තිබෙන පහත දැක්වෙන අබලි භාණ්ඩ මිලයට ගෙන රැගෙන යාම සඳහා එවන මුද්‍රා තැබූ ටෙන්ඩර් කොළඹ 5, කිරුළ පාරේ අංක 200 වෙනි ස්ථාන යේ පිහිටි ලංකා ගමනා ගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභා පති තැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දින යන් පහත පෙනෙන ඒ ඒ භාණ්ඩ ඉදිරියෙන් දක්වා ඇත.

1. **සුන්බුන් ද්‍රව්‍ය.**—බැටරි, රබර් පියුබ්, ප්ලැප්, සිමෙන්ති උර, දුනු කොල, බෝල් රේසර් යනාදිය ඇතුලත්වේ. ටෙන්ඩර භාර ගන්නා අවසාන දිනය 1973. 10. 16 වෙනි දින පෙරවරු 10 වන තෙක්.

2. **ගර්හිත යන්ත්‍ර සූත්‍ර සුන්බුන්.**—තෙල් චූෂණ පොම්ප, වතුර පොම්ප, ජැක්තු, පා පොම්ප, බෝරිං යන්ත්‍ර, යනාදිය ඇතුළත් වේ. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය 1973.10.18 වෙනි දින පෙරවරු 10 වන තෙක්.

ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනවලට පෙර දින පස්වරු 3 වන තෙක් මෙම කාර්යාලයෙන් ටෙන්ඩර් පෝරම ලබාගත හැකි අතර එක් ටෙන්ඩර් පෝරම කට්ටලයකට රු. 10 බැගින් තැන්පත් කළ යුතුය. මෙම මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට ප්‍රථම ටෙන්ඩර් තැන්පත් මුදලින් ගෙවිය යුතුවේ.

ටෙන්ඩර් භාණ්ඩ ලැයිස්තු, ටෙන්ඩර් තැන්පත් මුදල් පිළිබඳ විස්තර යනාදිය මගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ප්‍රධාන සම්පත් නිලධාරී තැන
වෙනුවට.

වේරහැර,
බොරලැස්ගමුව.

9–762—73.09.28 දින අංක 79 දරන ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

#### පී. වී. සී. හෝස්පයිප්ප සැපයීම සඳහා මිළ ගණන් කැඳවීම

අංක එල්කිව/2/727302

පහත දක්වෙන ද්‍රව්‍ය සැපයීම සඳහා 1973.10. 31 වනද පස්වරු 1.30 දක්වා, පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ඉංජිනේරු අංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වරයා විසින් මිළ ගණන් කැඳවනු ලැබේ.

| අංකය | විස්තරය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|
| (1) ... | අඟල් දෙක හමාරේ (2½) විෂ්කම්භයකින් යුත් අඩි 100ක් දිග, නැමෙන සුළු පී. වී. සී. හෝස් පයිප්ප. මේවා වර්ග අඟලකට රාත්තල් 125 ක උපරිම පීඩනයකට ඔරොත්තු දෙන ඒවා විය යුතුය. එක් එක් හෝස්පයිප්පයට පිරිමි හා ගැහැණු පිරිද්දීම සවිකොට, ක්ලිප්ස් ගසා තදකර තිබිය යුතුය ... ... ... ... | අඩි 5,000 යි |
| (2) ... | අඟල් දෙකක (2) විෂ්කම්භයකින් යුත්, අඩි 100ක් දිග, නැමෙන සුළු පී. වී. සී. හෝස් පයිප්ප, මේවා වර්ග අඟලකට රාත්තල් 125 උපරිම පීඩනයකට ඔරොත්තු දෙන ඒවා විය යුතුය. එක් එක් හෝස් පයිප්පයකට පිරිමි හා ගැහැණු පිරිද්දුම් සවිකොට, ක්ලිප්ස් ගසා තද කර තිබිය යුතුය ... ... ... ... | අඩි 5,000 යි |

(2) "පී. වී. සී හෝස් පයිප්ප සැපයීම සඳහා මිළ ගණන් කැඳවීම එල්කිව/2/727302 අවසාන දිනය 1973.10.31 වනද පස්වරු 1.30"ට යනුවෙන් වම් පස ඉහල කෙළවරේ සඳහන් කරනු ලැබූ සීල් තැබූ කවරයක බහාලූ මිළ ගණන් පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ඉංජිනේරු අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වරයා වෙත නියමිත දින ඉහත සඳහන් වේලාව නොඉක්මවා ලැබෙන සේ එවිය යුතුය.

(3) මිළ ගණන් භාර ගැනීම අවසන් කරන දින සිට සති 4 ක් ගතවන තුරු සියළුම මිළ ගණන් ඉදිරිපත් කිරීම භාරගැනීම සඳහා විවෘතව තැබිය යුතුය.

(4) කිසියම් මිළ ගණන් ඉදිරිපත් කිරීමක් හෝ සියල්ලම හෝ ප්‍රශ්ණ කරනු ලැබීමෙන් තොරව ප්‍රතික්ෂේප කිරීමේ හා කිසියම් මිළ ගණන් කැඳවීමක් හෝ ඉන් කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුවෙයි.

එස්. කතිර්කාමතම්බි,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

ඉංජිනේරු අංශය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙනිය.

9–701/1—73.09.28 දින අංක 79 දරන ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

#### කෘත්‍රිම වර්ෂා කාරක වාරිමාර්ග පයිප්ප (ස්ප්‍රිංක්ලර්ස්) හා සවිකිරීමේ උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

ටෙන්ඩර් අංක එමටී/2/727308

පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් පහත දක්වා ඇති පයිප්ප හා සවිකිරීමේ උපකරණ සැපයීම සඳහා වූ ටෙන්ඩර් පත් 1973.10.31 වනද පස්වරු 1.30 දක්වා භාරගනු ලැබේ.

| අංකය | විස්තරය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|
| 1 ... | අඟල් 2 විෂ්කම්භයකින් යුත් ගැල්වනයිස් පුටටුවලට ස්ථිරලෙස සවිකළ හැකි, වර්ග අඟලකට රාත්තල් 200 ක උපරිම, පීඩනයට ඔරොත්තු දෙන අඩි 20 ක් දිග, නාම්‍ය හෝ අනම්‍ය පී. වී. සී. පයිප්ප ... ... ... ... | කැලි 2,000 යි |
| 2 ... | අඟල් 3 විෂ්කම්භයකින් යුත් ගැල්වනයිස් පුටටුවලට ස්ථිර ලෙස සවිකළ හැකි, වර්ග අඟලකට රාත්තල් 200 ක උපරිම පීඩනයට ඔරොත්තු දෙන, අඩි 20 ක් දිග, නාම්‍ය හෝ අනම්‍ය පී. වී. සී. පයිප්ප ... ... ... ... | කැලි 1,000 යි |
| 3 ... | අඟල් 2 විෂ්කම්භයකින් යුත් ගැල්වනයිස් පුටටුවලට සවිකල හැකි, වර්ග අඟලකට රාත්තල් 200 ක උපරිම පීඩනයට ඔරොත්තු දෙන අඩි 40 ක් දිග, [illegible] නාම්‍ය හෝ අනම්‍ය පී. වී. සී. පයිප්ප ... ... | කැලි 1,000 යි |

### ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

අම්පාර දිස්ත්‍රික්කයේ මෙහි පහත දක්වා ඇති පාර තැනීම පිළිබඳව 73. 09. 07 වැනි දින අංක 76 දරණ ගැසට් පත්‍රයේ පළවූ ටෙන්ඩර් දැන්වීමේ සඳහන් ටෙන්ඩර්පත් භාරගැනීමේ අවසාන දිනය 1973. 10. 12 වැනි දින පෙ. ව. 10 දක්වා දීර්ඝ කර ඇත. 1973. 10. 10 වැනි දින ප. ව. 2 දක්වා අම්පාර දිසාපති විසින් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කිරීම 73. 10. 12 වැනි දින පෙ. ව. 10 ට සිදු කරන අතර ටෙන්ඩර් කරුවනට අවශ්‍ය නම් එදිනට පැමිණ සිටිය හැක.

| වැඩයේ නම | ලියාපදිංචි විය යුතු මුදල |
|---|---|
| දිගාමඩුල්ල ගම්සභා ප්‍රදේශයේ රණමඩුවේ සිට 10 ජනපදය මැදින් මධ්‍යම කඳවුර දක්වා ඇති පාරේ 13 ජන පදයේ 23 නිවාසය ලඟට ඇති කොටස | රු. 15,000.00 |

එස්. විජයසිංහම්,
අම්පාර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1973 සැප්තැම්බර් මස 17 වැනි දින,
අම්පාර දිසාපති කාර්යාලයේ දීය.

9–774—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

### ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

මගේ අංකය : ඉලි/6/91.

මොණරාගල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1973 ඔක්තෝම්බර් 24 දින පස්වරු 2 දක්වා මොණරාගල දිසාපති විසින් ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ.

(1) කටුගහගල්ගේ ජනපද පාරේ බෝක්කු තැනීම.
(2) කොටියාගල ජනපදයේ පොදු ළිං අළුත්වැඩියා කිරීම.
(3) හෙලතුන්තල වත්ත්‍යායේ පොදු ළිං තැනීම.
(4) තිස්ස-කතරගම ව්‍යාපාරයේ පොදු ළිඳක් තැනීම.
(5) රතුගල්ල ජලනල යෝජනා ක්‍රමය තැනීම.
(6) ඔක්කම්පිටිය ජා. නි. නිවාසයට ළිඳක් තැනීම.
(7) මාගන්දන ඉ. ක .ඕ. ළිඳ තැනීම.
(8) හෙලතුන්තල ගමට පොදු ළිඳක් තැනීම.
(9) මාගන්දන ඉ. ක. ඕ. නිවාසය අළුත් වැඩියා කිරීම.
(10) හුලන්දාව වම ජ. නි. නිවස අළුත්වැඩියා කිරීම.
(11) හුලන්දාව ජනපද නිලධාරි කාර්යාලය අළුත්වැඩියා කිරීම.
(12) හුලන්දාව දකුණ ඉ. ක. ඕ නිවස අළුත්වැඩියා කිරීම.
(13) හුලන්දාව වම ඉ. ක. ඕ නිවාසය අළුත්වැඩියා කිරීම.
(14) හුලන්දාව වම් ඉවුර ජනපදයේ කැබලි අංක 96-61 අතර පාර කැපීම.
(15) හුලන්දාව වම් ඉවුර ජනපදය කැබලි අංක 45 හා හුලන්දා ඔය අතර පාර තැනීම.
(16) කොටියාගල ජනපද නිලධාරි නිවාසය අළුත්වැඩියා කිරීම.
(17) ඉඩම් කොමසාරිස් ගරාජ වැඩි දියුණු කිරීම.
(18) මාගන්දන ජනපදයේ පොදු ළිං තුනක් තැනීම.

2. අංක එකේ සිට පහළට (1-15) දක්වා වැඩ සඳහා රු. 5,000 ක් හෝ ඊට වැඩි ගණනකට හා අංක දහසයේ සිට දහ අට දක්වා (16-18) වැඩ සඳහා රු. 10,000 ක් හෝ ඊට වැඩි ගණනකට හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ, මෙම කච්චේරියේ කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී සිටින අයට 1973 ඔක්තෝම්බර් 17 දින පෙරවරු 12 වන තෙක් මොණරාගල දිසාපති කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත් අපේක්ෂකයා විසින් මොණරාගල කච්චේරියේ හෝ වෙනත් කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයේ හෝ අංක එකේ සිට පහළට (1-15) දක්වා වැඩවලට එක් එක් වැඩය වෙනුවෙන් රු. 25 ක මුදලක් හා අංක දහසයේ සිට දහඅට (16-18) දක්වා වැඩ සඳහා එක් එක් වැඩය වෙනුවෙන් රු. 50 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මොණරාගල දිසාපති වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත් මුදල් ඇණවුම් තැපැල් ඇණවුම් ආදිය බාරගනු නොලැබේ.

4. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිති වලටද, ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණනකට හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ හෝ මෙම කච්චේරියේ කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී සිටින්නේ නම් මෙකී වැඩ සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැකි වේ. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් අනුමත කරනු ලැබූ සමිති නිදහස්ය. එහෙත් ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන්ට ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කොට අනුපිටපතක් ද සමග ලේඛණ ගත තැපැලෙන් එවිය යුතුය. සීල් තබන ලද ටෙන්ඩරයේ බහා එවන ලද ලියුම් කවරයේ උඩ වම් කෙළවරේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද, ලියා තැබිය යුතුය. ටෙන්ඩර් පත්‍ර තැපැලෙන් නොඑවන්නේ නම් මොණරාගල කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

6. 1973 ඔක්තෝබර් මස 24 දින ප. ව. 2 ට මොණරාගල දිස්ත්‍රික්කයේ උප දිසාපති කාර්යාලයේ දී, ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට පැමිණ සිටිය හැකිය.

7. ටෙන්ඩර්කරුවන් මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට එකඟ විය යුතුය.

8. වැඩි විස්තර මොණරාගල දිසාපතිගෙන් ලබා ගත හැකිය.

නිමල් සමරසුන්දර,
මොණරාගල දිසාපති වෙනුවට.

1973 සැප්තැම්බර් මස 03 දින,
මොණරාගල දිසාපති කාර්යාලයේ දීය.

9–670/1—73.09.28 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

### ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

මගේ අංකය : ඉලි/6/91.

මොණරාගල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1973 ඔක්තෝබර් මස 24 දින පස්වරු 2 දක්වා කොළඹ තැ. පෙ. අංක 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

(1) හුලංදාව වම්ඉවුර ජනපදයේ කැබලි අංක 35-96 අතර පාර තැනීම.

(2) හුලංදාව වම් ඉවුර ජනපදයේ කැබලි අංක 59-52 අතර පාර තැනීම.

(3) නාමල්ඔය ජනපද පාර තැනීම.

(4) කොටියාගල ජනපදයේ බී. ඕ. පී. පාර තැනීම.

(5) හුලංදාව වම් ඉවුර ජනපදයේ කැබලි අංක 81-96 අතර පාර තැනීම.

2. රු. 50,000 හෝ ඊට වැඩි ගණනකට හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ, මෙම කච්චේරියේ කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී සිටින අයට 1973 ඔක්තෝබර් 17 වන දින පෙරවරු 12 දක්වා මොණරාගල දිසාපති කාර්යාලයේ දී ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර අපේක්ෂකයා විසින් මොණරාගල කච්චේරියේ හෝ වෙනත් කච්චේරියක හෝ කොළඹ, මහා භාණ්ඩාගාරයේ හෝ අංක 1 සිට 5 දක්වා ඇති වැඩවලට එක් එක් වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මොණරාගල දිසාපති වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිතිවලට ද ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණනකට හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ හෝ මෙම කච්චේරියේ කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී තිබෙන්නේ නම් මෙකී වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ හැකි වේ. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් අනුමත කරනු ලැබූ සමිති නිදහස් ය. එහෙත් ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන්ට ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට ටෙන්ඩර් පත් ඉදිරිපත් කරනු ලැබේ.

5. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කොට අනුපිටපතක් ද සමග ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. සීල් තබන ලද ටෙන්ඩරය බහා එවන ලියුම් කවරය උඩ වම් කෙළවර ටෙන්ඩර්කරුගේ නම ද, ලිපිනය ද, වැඩෙහි නම ද ලියා තිබිය යුතු ය. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් නො එවන්නේ නම් ගාලු මෝදර මහ ලේකම් කාර්යාලය අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතු ය.

6. 1973 ඔක්තෝබර් මස 24 වෙනි දින පස්වරු 2 ට ඉහත කී අංක 320 දරණ කාමරයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ පැමිණ සිටිය හැකි ය.

7. ටෙන්ඩර්කරුවන් මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට එකඟ විය යුතුය.

8. වැඩ විස්තර මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති තැන ගෙන් ලබා ගත හැකි ය.

නිමල් සමරසුන්දර,
මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1973 සැප්තැම්බර් මස 03 දින,
මොණරාගල,
දිසාපති කාර්යාලයේ දී ය.

9-670/2—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

### ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

යාපනය දිස්ත්‍රික්කයේ, පහත සඳහන් වැඩ සඳහා 1973.10.26 වෙනි දින පස්වරු 1 දක්වා කොළඹ තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ, සභාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

| වැඩයේ ස්වභාවය | ලියාපදිංචි වියයුතු මුදල |
|---|---|
| 1. යාපනය දිස්ත්‍රික්කයේ පූනකරි ප්‍රා.ආ. නි. කොට්ඨාශයේ පිහිටා ඇති ම. ප. කජ්ජි වගා ව්‍යාපාරයේ අභ්‍යන්තර පාරවල් තැනීම. | රු. 28,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙහි සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි මුදලකට මහා මාර්ග වාරි මාර්ග හෝ අධ්‍යාපන යන දෙපාර්තමේන්තුවක කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති, හා සමුපකාර සමිති වලට සහ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන්ටද 1973 ඔක්තෝබර් මස 22 වැනි දින පස්වරු 1.30 දක්වා යාපනය කච්චේරියේ ඉඩම් ශාඛාවේදී ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත. කොන්ත්‍රාත්තුව බලාපොරොත්තු වන අය තමන් එසේ ලියාපදිංචිවී ඇති බවට සාක්ෂි යාපනය දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

3. එක් සත් ටෙන්ඩර් වෙනුවෙන් රු 25 ක තැන්පත් මුදලක් ගෙවූ බවට වූ කුවිතාන්සියක් ඉදිරිපත් කොට යාපනය දිසාපතිගෙන් ලබාගත හැකි ආකෘතිවල දෙපිටපතකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල මේ දැන්වීම පළකරනු ලැබීමෙන් පසු තැන්පත් කළ යුතු අතර, එම තැන්පතුවට සාක්ෂි වශයෙන් ලබාගන්නා ලද කුවිතාන්සිය ටෙන්ඩරයට ඇමිනිය යුතුය. අනුමත සමිති ටෙන්ඩර් තැන්පතුවෙනුත් ඇප තැන්පතුවෙනුත් නිදහස් ය. එසේ වුවද, ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබෙන්නේ ඉහත සඳහන් ලියාපදිංචිය ඉදිරිපත් කළ විට පමණි.

4. ටෙන්ඩර් පත් කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩරය ආවරණය කරන කවරය මුද්‍රා තැබිය යුතු අතර, එහි වම් පස උඩ කෙළවරේ වැඩයේ නම සඳහන් කළ යුතුය. ටෙන්ඩරය ලියාපදිංචි තැපෑලෙන් නොඑවනු ලැබේ නම් එය ගාලු මුවදොර, කොළඹ මහලේකම් කාර්යාලයේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව නියමිත දිනයට පෙර පැමිණ තැන්පත් කළ හැකිය.

5. පළමුවෙනි ඡේදයේ දැක්වෙන වේලාවට පසු ලැබෙන ටෙන්ඩර් භාර ගනු නොලැබේ.

6. ටෙන්ඩර් භාර ගැනීම අවසානවූ විට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන් පැමිණ සිටිය යුතුය.

7. ටෙන්ඩරය බාරගන්නා ලද බව ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබ දින 10 ක් ඇතුළත යම් කෙනෙකු ගිවිසුමට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළොත් හෝ අත්සන් කිරීමට අසමත් වුවහොත් එසේ නැතහොත් අනුමත කරන ලද ඇප මුදල බැඳීමට අසමත් වුවහොත් ටෙන්ඩර් තැන්පතුව රාජසන්තක කරනු ලැබේ.

8. පිළිගනු ලැබූ කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවීමේදී සේවයට ගත යුත්තේ පුහුණු හා නුපුහුණු ලාංකික කම්කරුවන් පමණක් වන අතර, හැකිතාක් දුරට එම කම්කරුවන් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම බඳවා ගත යුතුය.

9. පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුට ගිවිසුමක් අත්සන් කිරීමටත්, ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට 5 ක් ඇප වශයෙන් යාපනය දිසාපති වෙත තැන්පත් කිරීමටත්, එම ගිවිසුම අත්සන් කරනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත වැඩ අවසන් කර බාරදීමටත් නියම වනු ඇත.

10. වැඩ පිළිබඳ වෙනත් අවශ්‍ය විස්තර ඇත්නම් යාපනය දිසාපතිගෙන් ලබා ගත හැකිය.

11. පැහැර හැරි කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවේ නම් සඳහන් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් භාර ගනු නොලැබේ.

12. ප්‍රශ්නයෙන් තොරව, කිසියම් ටෙන්ඩරයක් හෝ සියලු ටෙන්ඩර හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ භාරගැනීමේ අයිතිය ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තබා ගනී.

13. ටෙන්ඩර්කරුවන් තමන් ඉදිරිපත් කරන ගණන්, ටෙන්ඩර් විවෘත කරනු ලබන දිනයේ සිට මාසයක් විවෘතව තැබිය යුතුය.

වී. මුරුගේසපිල්ලෙයි,
උප දිසාපති,
යාපනය දිසාපති වෙනුවට.

1973 සැප්තැම්බර් මස 3 වෙනි දින,
ඉඩම් ශාඛාව, කච්චේරිය,
යාපනය.

9-700—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

### ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

අංකය : සංවැ/101-11.

රත්නපුර දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1973 ඔක්තෝබර් මස 19 වෙනි සිකුරාදා පස්වරු 2.30 දක්වා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| වැඩෙහි ස්වභාවය | | ලියාපදිංචි වියයුතු මුදල රුපියල් |
|---|---|---|
| (1) මඩලගම තේ ව්‍යාපාරයේ 3 සැතපුමේ 1 භාගය තාර දැමීම | ... | 25,000 |
| (2) අයගම තේ ව්‍යාපාරයේ 2 පියවරේ 2 සැතපුමේ 1 භාගය තාර දැමීම | ... | 25,000 |
| (3) ඉඹුල්පේ තේ ව්‍යාපාරයේ 1 සැතපුමේ 2 භාගයේ බෝක්කු තැනීම | ... | 50,000 |
| (4) මලන්ගම-යායදෙනිය පාරේ පස්වැඩ සහ බෝක්කු තැනීම | ... | 25,000 |
| (5) කොස්පැලවින්න-කැකුනගොඩැල්ල පාරේ (සැතපුම් බාගයක්) තැනීම | ... | 25,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියාපදිංචි වී සිටින අයට 1973 ඔක්තෝබර් 16 වෙනි අඟහරුවාදා දහවල් 12 වන තෙක් රත්නපුර දිසාපති කාර්යාලයේදී ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර අපේක්ෂකයන්ට රත්නපුර කච්චේරියේ හෝ වෙනත් කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයේ හෝ එක් එක් වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් රත්නපුර දිසාපති වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර්පත් ලබා ගත හැකිය. චෙක්පත්, මුදල් අණවුම් හා තැපැල් අණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද, ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචිවී ඇත්නම්, මෙකී වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ හැකි වේ. අනුමත කරනු ලැබූ සමිති ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් නිදහස් ය. එහෙත්, ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන්ට ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණකොට අනුපිටපතක්ද සමග ලේඛන ගත තැපෑලෙන් එවිය යුතුය. සිල් තබන ලද ටෙන්ඩරය බහා එවන කවරයේ උඩ වම් කෙළවරේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද ලියා තිබිය යුතුය. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් නො එවන්නේ නම් ගාලු මුවදොර පරණ මහා ලේකම් කාර්යාලයේ, අංක 320 දරණ කාමරයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුවේ.

6. 1973 ඔක්තෝබර් 19 වෙනි සිකුරාදා පස්වරු 2.30 ට ඉහත කී අංක 320 දරණ කාමරයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට හෝ පැමිණ සිටිය හැකිය.

7. ටෙන්ඩර්කරුවන් මෙම කොන්ත්‍රාත්තු යටතේ වැඩ කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට එකඟවිය යුතුයි.

8. වැඩි විස්තර රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපතිගෙන් ලබාගත හැකිය.

ඇස්. සී. මානික්කවාසගර්,
අතිරේක දිසාපති,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1973 සැප්තැම්බර් 17 දින,
රත්නපුර දිසාපති කාර්යාලයේ දී ය.

9-709—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

1973. 09. 07 වන දින අංක 76 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම මෙයින් අවලංගු කරමි.

වයි. බී. පුස්සදෙනිය,
සහකාර දිසාපති,
නුවරඑළියේ දිසාපති වෙනුවට.

1973. 09. 18 වන දින,
නුවරඑළියේ දිසාපති කාර්යාලයේ දීය.

9-784—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

බදුල්ල සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාශය

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1974 ජනවාරි 1 වැනිද සිට 1974 දෙසැම්බර් 31 වැනිද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර බදුල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාර ගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද, තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු, මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුර, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍යාලවලින් ලබාගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනයට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි, ආකෘති පත්‍ර සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට පෙර තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා ආකෘති පත්‍ර ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වන තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරී, බදුල්ල'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිළිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ ලේකම්ට භාරදෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුන බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙ. ව. 10ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්‍යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවහොත් ටෙන්ඩර් පෝර්මයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම්, එම පාලන මිළ ගණන් අනුව ගෙවීම් කරනු ලැබේ.

8. **ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද, පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනයක මවිසින් හෝ බලය පවරනු ලැබූ මාගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනසක් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයේ 3 වැනි තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩුබාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම් තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි (i).—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් විමට බලාපොරොත්තුවන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම, පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුය.

(ii) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 3½ක් ඇතුලත් වන සේ බත් වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිල ගණන් දැක්විය යුතුය.

(iii) දැනට ආහාර උපලේඛනයේ දක්වා ඇති සහල් අවුන්ස 12 ප්‍රමාණය අවුන්ස 7 වශයෙන් වෙනස්කර ඇති නිසා, ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීම අනවශ්‍ය වනු ඇත.

(iv) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිලට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු මුදල් ගෙවිය යුතුය. දැනට සලාක නොවන සහල් රාත්තලක මිල ශත 65 කි.

පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිළට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩුකරනු ලැබේ.

කිසියම් අවස්ථාවකදී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිලට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිලේ සහ සලාක සහල් මිලේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩුකරගනු ලැබේ.

(v) කූපන් භාර නුදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන් ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩුකරනු ලැබේ:—

(අ) කූපන්වලට ලබා ගන්නා සහල් දැනට මෙන් නොමිලයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩුකරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිලට නම් නොසපයනු ලබන පාන්වල මිළෙත් සහල් සලාක මිළෙත් වෙනස අඩුකරගනු ලැබේ.

දොස්තර ඒ. සී. එස්. ජයසිංහ,
බදුල්ල සෞඛ්‍ය සේවා අධිකාරී (නියෝජ්‍ය).

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
බදුල්ල,
1973 සැප්තැම්බර් මස 6 වැනි දින දීය.

උපලේඛනය 1974

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට: මාළු | බිත්තර | මස් | කරවල | එළවළු | නොගෙවන රෝගීන්ට: මාළු | බිත්තර | මස් | කරවල | එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල්. | රුපියල්. | | | | | | | | | | | |
| 1. මහඔය දිසා රෝහල | 100... | 800 | | 500... | 500... | 500... | 500... | 1,500... | 800... | 800... | 800... | 800... | 2,200 |
| 2. කොස්ලන්ද දිසා රෝහල ... | 100... | 800 | | 500... | 500... | 500... | 500... | 1,500... | 2,700... | 2,700... | 2,700... | 2,700... | 8,100 |
| 3. මැටිගහතැන්න දිසා 3. ... රෝහල ... | 100... | 700 | | 500... | 500... | 500... | 500... | 1,500 | 800... | 800... | 800... | 800... | 2,400 |
| 4. මැදගම දිසා රෝහල | 100... | 700 | | 500... | 500... | 500... | 500... | 1,500 | 800... | 800 | 800... | 800... | 2,400 |
| 5. මීගහකියුල ප. ඒකකය ... | 100... | 700 | | 300... | 300... | 300... | 300... | 900 | 700... | 700... | 700... | 700... | 2,100 |
| 6. සියඹලාන්ඩුව ප. ඒකකය ... | 100... | 700 | 73.10.15 | 300... | 300... | 300... | 300... | 900 | 700... | 700... | 700... | 700... | 2,100 |
| 7. වැල්ලවාය ග්‍රා. රෝහල | 100... | 800 | පෙරවරු | 250... | 250... | 250... | 750... | 750 | 800... | 800... | 800... | 800... | 2,400 |
| 8. දියතලාව දිසා රෝහල ... | 100... | 800 | 10ට | 500... | 500... | 500... | 500... | 1,500 | 1,000... | 1,000... | 1,000... | 1,000... | 3,000 |
| 9. උරණිය ග්‍රා. රෝහල | 100... | 600 | | 150... | 150... | 150... | 150... | 450 | 700... | 700... | 700... | 700... | 2,100 |
| 10. තණමල්විල ප්‍රා. රෝහල ... | 100... | 800 | | 600... | 600... | — ... | 600... | 2,400... | 600... | 600... | — ... | 600... | 2,000 |
| 11. වැවේගම මාතෘ නිවාසය ... | 100... | 400 | | 100... | 100... | 100... | 100... | 400 | 600... | 600... | 600... | 600... | 2,000 |
| 12. ඇටම්පිටිය මාතෘ නිවාසය ... | 100... | 400 | | 200... | 200... | 200... | 200... | 800 | 600... | 600... | 600... | 600... | 2,000 |
| 13. හල්දුම්මුල්ල මාතෘ නිවාසය ... | 100... | 400 | | 200... | 200... | 200... | 200... | 600 | 600... | 600... | 600... | 600... | 2,000 |

9—702—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—රත්නපුර කොට්ඨාශය

කිරිනොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් සහ සේවා.**—වර්ෂ 1974.1.1 සිට 1974.12.31 වැනිදා දක්වා (දින දෙකම ඇතුලුව) කාලය තුල මේ සමග ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයින්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර රත්නපුර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද, සමුපකාර සමිති ඇතුලත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැකිය. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේදී අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, මහනුවර සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයේ දවල් 12.00 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කලුතර, නුවර, කෑගල්ල, මාතර, මාතලේ, පුත්තලම, කුරුණෑගල සහ වවුනියාව යන පලාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කල බවට සාක්ෂි වශයෙන් නිකුත් කරණ ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරණ අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට යතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දැන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙණෙන දෙවැනි ඡේදයේ දෙවැනි කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරණ ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **සෝදන කැලි පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කැලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 4 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙක්කින් යුතුව කවරයක බහා සෞඛ්‍ය සේවා අධිකාරී, රත්නපුර කියා එවිය යුතුයි. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කලයුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි දමන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි/ලේකම් මහතාට (හෝ මාහට) දීමෙන් එය ලැබුණු බවට ඔහු හෝ මා විසින් නිකුත් කරණු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි කල තැපෑලෙන් හෝ ලැබීමට සැළැස්විය හැක.

6. **ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙණෙන උපලේඛනයේ 6 වැනි තීරයේ සඳහන් දින පෙරවරු 10. ට ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරණු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරණ වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් ඉදිරිපත් කරණ මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳව සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමහ කටයුතු පිළියෙළ කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායෙහි පිටපත් පරීක්ෂා කල හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරණ ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරණ ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත්වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙණෙන උපලේඛනයෙහි 3 වැනි තීරයේ සඳහන් වන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කල යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත.**—ටෙන්ඩර් කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දෙසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත් කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැළසුවහොත් ඊට යන වියදම් ආදිය පලාතේ ආදායම් පාලක නිලධාරි තුමා තක්සේරු කළ ගණන් වලට අනුව වවුවරයෙන් කපාගනු ලැබේ.

(ii) කිළිටි රෙදිවල විෂබීජ නැතිකිරීම සහ එහා මෙහා ගෙනයාමේ වියදම් යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැතිකිරීම සඳහා වෙන ස්ථානයකට ගෙන යාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පලාත් පාලන මංඩල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පලාත් පාලන මංඩල තුල ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කල හැක්කේ ඒ ඒ මංඩල තුල ඇති නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරණ ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර් කරුවන්ට උවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කල හැකිය.

වී. ඩී. ටී. ද සිල්වා,
රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරී.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
රත්නපුර,
1973.09.14

## උපලේඛනය

| | 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|---|
| | ආයතනය | ටෙන්ඩර් තැන්පත් මුදල | ඇප මුදල | මසකට සේදිය යුතු කැලි ගණන | මසකට සේදිය යුතු වාර ගණන | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව |
| | | රු. | රු. | | | |
| 1. | අයගම ... ... ... ... | 25 ... | 75 ... | 250 ... | 3 | 1973.10.16 පෙරවරු 10 ට |
| 2. | ඇහැලියගොඩ ... ... ... | 25 ... | 100 ... | 2,240 ... | 4 | |
| 3. | ඇඹිලිපිටිය ... ... ... | 25 ... | 75 ... | 500 ... | 3 | |
| 4. | බලන්ගොඩ ... ... ... | 25 ... | 100 ... | 2,200 ... | 4 | |
| 5. | ගල්ලැල්ල ... ... ... | 25 ... | 75 ... | 200 ... | 3 | |
| 6. | ගිලීමලේ ... ... ... | 25 ... | 75 ... | 350 ... | 3 | |
| 7. | ගොඩකවෙල ... ... ... | 25 ... | 75 ... | 400 ... | 3 | |
| 8. | කහවත්ත ... ... ... ... | 25 ... | 100 ... | 1,500 ... | 4 | |
| 9. | කල්තොට ... ... ... | 25 ... | 75 ... | 200 ... | 3 | |
| 10. | කලවාන ... ... ... | 25 ... | 75 ... | 450 ... | 3 | |
| 11. | කිරිඇල්ල ... ... ... | 25 ... | 75 ... | 400 ... | 3 | |
| 12. | කොලොන්න ... ... ... | 25 ... | 100 ... | 1,000 ... | 4 | |
| 13. | මහවලතැන්න ... ... ... | 25 ... | 75 ... | 350 ... | 3 | |
| 14. | නිවිතිගල ... ... ... ... | 25 ... | 75 ... | 150 ... | 3 | |
| 15. | පල්ලෙබැද්ද ... ... ... | 25 ... | 75 ... | 350 ... | 3 | |
| 16. | පොතුපිටිය ... ... ... | 25 ... | 75 ... | 200 ... | 3 | |
| 17. | රක්වාන ... ... ... ... | 25 ... | 100 ... | 1,200 ... | 4 | |
| 18. | රන්වල ... ... ... ... | 25 ... | 75 ... | 100 ... | 3 | |
| 19. | රත්නපුරය (1) ... ... ... | 100 ... | 200 ... | 13,000 ... | දිනපතා | |
| 20. | රත්නපුරය (2) ... ... ... | 100 ... | 200 ... | 5,500 ... | 4 | |
| 21. | වැලිගෙපොල ... ... ... | 25 ... | 75 ... | 200 ... | 3 | |
| 22. | වන්දිකාවැව ... ... ... | 25 ... | 75 ... | 600 ... | 3 | |
| 23. | එරත්ත ... ... ... ... | 25 ... | 75 ... | 150 ... | 3 | |

9—703/2—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—රත්නපුර කොට්ඨාශය

### 1974 ගබඩා ප්‍රවාහණය කිරීම

**සේවයට සහ ටෙන්ඩර් දැමීමට සුදුසු පුද්ගලයින්.**—මේ කාර්යාලයෙන් හෝ මෙහි මතු 2 වන ඡෙදයේ සඳහන් කාර්යාලවලින් හෝ ඉල්ලා ලබාගත යුතු උපලේඛනවල දක්වා ඇති තොරතුරු පරිදි, 1974.1.1 වනද සිට 1974.12.31 වනද දක්වා වකවානුව තුළ දුම්රිය පොළෙන්/පොළවලින්/පොළවලට/පොළට/ආයතනවලින්/කාර්යාලයට/කාර්යාලයෙන් ගබඩා බඩු ඇදීම සඳහා ලාංකික වූ පුද්ගලයින්ගෙනුත්, ලාංකික ව්‍යාපාර ආයතනවලිනුත්, සමූපකාර සමිතිවලිනුත්, රත්නපුර සෞ.සේ. අධිකාරි තැන ටෙන්ඩර් භාරගනු ලැබේ.

සඳහන් මිළ ගණනට කම්කරු ගාස්තු සහ පැටවීම් කුලී ද ඇතුළත් විය යුතුයි.

2. ටෙන්ඩර් එවිය යුත්තේ ඊට නියම වූ ආකෘති පත්‍රය මතයි. රු. 100ක මුදලක් ලහම ඇති කච්චේරියේ රත්නපුර සෞ. සේ. අධිකාරි නමට තැන්පත් කොට එහි ලදුපත ලබාගෙන ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු සඳහා ටෙන්ඩර්කරු නිසි පරිදි අත්සන් කළ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඒ ලදුපත සමඟ ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍ර 1974.10.15 වන ද දවල් 12 දක්වා මතු සඳහන් සෞ.සේ. අධිකාරි කාර්යාලවලින් බලා ගත හැකිය :—

අනුරාධපුරය, ගාල්ල, කෑගල්ල, පුත්තලම, මඩකලපුව, යාපනය, කුරුණෑගල, රත්නපුරය, බදුල්ල, කළුතර, මාතලේ, වවුනියා, කොළඹ, මහනුවර, මාතර.

නියමිත ආකෘති පත්‍රයේ නොවන කිසිදු ටෙන්ඩරයක් සැළකිල්ලට ලක් නොවේ.

3. තමන් දෙපාර්තමේන්තුව සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳී ඇතත් නැතත් සියලු ටෙන්ඩර්කරුවන් විසින් වටිනාකම පිළිබඳ වගතුග සැපයිය යුතුය. මේ සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර ඉහත 2 වන ඡෙදයෙන් කියවුණු කවර හෝ සෞ. සේ., අධිකාරි කාර්යාලයකින් ලද හැකි වේ.

4. එක් එක් පිටපතක් ටෙන්ඩර්කරුගේ අත්සන ඇතිව දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතු ටෙන්ඩර් පත්‍ර "බඩු ප්‍රවාහණය කිරීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් වම් පැත්තේ උඩු කෙළවරේ සළකුණක් තබා රත්නපුර සෞ. සේ. අධිකාරි වෙත පිට නම ලියූ කවරයක බහා අස් ඔබා (සීල් තබා) එවිය යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර 1973.10.15 වන ද දහවල් 12 ට පෙර රත්නපුර සෞ. සේ. අධිකාරි වෙත ලැබෙන සේ ඔහු වෙත පිට නම ලියා ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් සෞ. සේ. අධිකාරි කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ හෝ තැන්පත් කළ යුතුය. ටෙන්ඩර්කරුවන් කැමැති නම් ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කවර වලින් යුත්, අස්එබූ (සීල් තැබූ) ටෙන්ඩර් පත්‍ර ඒ ඒ සෞ. සේ. අධිකාරි කාර්යාලවල ලේකම්/ගණකාධිකාරි වෙත භාරදී ඊට ලදු පතක් ලබා ගැනීමට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ අවසර ඇත.

6. ටෙන්ඩර් දමන මිළ ගණන් පැහැදිලි ඉලක්කමෙන් දක්වා වචනයෙන් ද නැවත ලියා තිබිය යුතුයි. වෙනස් කිරීම් හා මකා දැමීම් සියල්ල ටෙන්ඩර්කරු විසින් අත්සන් තබා අනුමත කොට තිබිය යුතුයි. නැත්නම් ටෙන්ඩර් පත්‍රය නොසරුප් සේ සළකා පිටු දකුණු ලැබිය හැකිය.

7. බඩු ප්‍රවාහණය කිරීම් සඳහා සෑහෙන තරම් ප්‍රවාහණ පහසුකම් සැළසීමට ටෙන්ඩර්කරුවන්ට පිළිවන්කම තිබිය යුතුයි. මේ මෙහෙය සඳහා යොද ගැනිමට යන වාහනවල ස්වරූපය ටෙන්ඩර් එවිය විට දක්විය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍ර, 1973.10.16 වන ද පෙ. ව. 10 ට සෞ. සේ. අධිකාරි කාර්යාලයේදී විවෘත කරණු ඇත. ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ වරම් ලත් නියෝජිතයින්ට තමන් කැමති නම්, රත්නපුර සෞ. සේ. අධිකාරි සමග විධිවිධාන සලසා ගෙන ඔහුගේ අවසරය පිට ටෙන්ඩර් විවෘත කරන විට පෙනී සිටිමින් තමන් ඉදිරිපත් කළ ටෙන්ඩර්යේ වෙදන පිටපත පිරික්සිය හැකිය.

9. ටෙන්ඩර්කරුවන්, තමන් ඉදිරිපත් කරන මිළ ගණන්, ටෙන්ඩර් භාර ගැනීම අවසන් වන දවසේ සිට හය මාසයක් දක්වා පිළිගත හැකි සේ තබා ගත යුතුයි. ඉදිරිපත් කළ ටෙන්ඩර් පත්‍ර පසුව අස්කළ හැකි නොවේ.

10. රත්නපුර සෞ. සේ. අධිකාරි ඉල්ලා සිටියහොත්, තමන් ගන්නා කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට තමන් පොහොසත් බවට සාක්ෂි හැටියට ලියකියවිලි හෝ වෙනත් සාධක හෝ ඉදිරිපත් කිරීමට ටෙන්ඩර්කරුවන් සූදනමින් සිටිය යුතුයි.

11. මේ කොන්ත්‍රාත්තුව යටතේ සිය කාර්ය ඉටු කිරීමේදී ටෙන්ඩර්කරු සේවයට ගත යුත්තේ ලාංකිකයින් පමණකි. "ලාංකිකයා" යනුවෙන් හැඳින්වෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් හෝ ලංකාවේ පුරවැසිකම ලැබුවෙකි. රත්නපුර සෞ. සේ. අධිකාරිගේ අවසරය සහ අනුදැනුම කලින් නොලැබ ලාංකික නොවන කම්කරුවන් සේවයට ගැනීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළාක් සේ සලකා කොන්ත්‍රාත්තුව අවලංගු කොට එහි කොන්දේසි ප්‍රකාර දඩයන්ට කොන්ත්‍රාත්කරු යටත් කළ හැකි වරදකි.

12. 1934 අංක 19 දරණ කම්කරු වන්දි මුදල් ආඥපනත හෝ එහි සංශෝධන ලිපිල් කිරීම, එකතු කිරීම යන කිසිවක් හෝ යටතේ යම්කිසි සේවකයකු විසින් ඉදිරිපත් කරන්නට යෙදෙන යම් හිමිකමක් වෙතොත් කොන්ත්‍රාත්කරු විසින් ඒ හැම දෙයකින්ම ආණ්ඩුව මුද ගත යුතුයි.

13. රත්නපුර සෞ. සේ. අධිකාරි තැන ඉල්ලා සිටින පරිදි මුළු කොන්ත්‍රාත්තුව හෝ ඉන් කොටසක් හෝ වෙනුවට රු. 700 කට නොවැඩි ඇප මුදලක් තැබීම අවශ්‍ය වනු ඇත.

14. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස ඉටු කරන බවට සෞ. සේ. අධ්‍යක්ෂ සමග කොන්ත්‍රාත්තුවකට බැඳිය යුතුයි. ටෙන්ඩර්කරුගේ ටෙන්ඩරය භාරගත් බවට රත්නපුර සෞ. සේ. අධිකාරි විසින් හෝ ඔහුගේ නිසි වරම දරණ නියෝජිතයකු විසින් හෝ ටෙන්ඩර්කරුට දන්වා දස දිනක් ඇතුළතදී කොන්ත්‍රාත්තුවට අත්සන් කිරීමට හෝ නියමිත ඇප මුදල ලැබීමට හෝ ටෙන්ඩර්කරු මැළිවුවහොත් හෝ අපොහොසත් වුවහොත් හෝ තැන්පත් මුදල රාජසන්තක වී රජයේ ගිවිසුම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඔහුගේ නම ද ඇතුලත් කිරීමට ද හේතුවේ. ටෙන්ඩර්ය භාරගත් බව දක්වෙන නිවේදනය ටෙන්ඩර්කරු සිය ටෙන්ඩරයේ දී ඇති ලිපිනයට තැපෑලෙන් යවා තිබේනම්, නැතහොත් ඒ ලිපිනය ඇති තැන දමා තිබේ නම්, එය ටෙන්ඩර්කරුට ලැබුණ බවට ගණන් ගනු ලැබේ.

15. රත්නපුර සෞ. සේ. අධිකාරිගේ අවසරයක් කලින් නොගෙන මේ කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට පැවරීම හෝ බෙදදීම හෝ නොකට යුතුයි. කොන්ත්‍රාත්කරුවකු තමින් වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කරණු පිණිස අන් අයෙකුට බලය පවරමින් නිකුත් කළ ප්‍රතිනිධි බලය නොපිළිගැනීමේ අයිතිය රජය සතු වේ.

16. රත්නපුර සෞ. සේ. අධිකාරි තැන සෑහෙතැයි තමන්ට පෙනෙන හේතු නිසා, තමා නම් සඳහන් කරන කිසියම් පුද්ගලයෙකු/පුද්ගලයින් කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීම ගැන සිය විරුද්ධත්වය ලියවිල්ලකින් කොන්ත්‍රාත්කරු වෙත දන්වා සිටි කල ඒ කියන තැනැත්තා/තැනැත්තන් කිසිවෙකුත් කොන්ත්‍රාත්කරු විසින් සේවයට නොගත යුතුයි.

17. කිසිදු ප්‍රශ්නයක් නැතිව ටෙන්ඩර් සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ පිටු දැකීමත්, යම් ටෙන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමත් රජය සතු අයිතියකි.

18. සෞ. සේ. අධ්‍යක්ෂ සමග කොන්ත්‍රාත්කරු බැඳුණු ගිවිසුම කවරක් වුවද, තමන් කැමැති අන්දමකින්, තමන් කැමැති කෙනෙකු ලවා එකී වැඩ කොටස කරවා ගැනීමේ නිදහස රත්නපුර සෞ. සේ. අධිකාරි වෙත තිබේ. එබඳු විටකදී වැඩ නැතිවීම නිසා තමන්ට වන පාඩුව පිරිමැසීමට යම්කිසි වන්දියක් හෝ අලාභයක් හෝ අඩු කිරීමක් හෝ වෙනත් සහනයක් හෝ ඉල්ලීමේ අයිතිය කොන්ත්‍රාත්කරුට නොලැබේ. ඔහු ඊට හිමිකරුවෙක්ද නොවේ.

19. ඉහතකී පරිදි කොන්ත්‍රාත්කරු වෙත පවරන ලද බඩු ගෙනගොස් බාරදීමට කොන්ත්‍රාත්කරු දෙතුන් වතාවක් ප්‍රමාද වූවොත් නැත්නම්, අපොහොසත් වූවොත් හෝ ඒ බඩු බාරදීමට පිට පිට අපොහොසත් වුවොත් හෝ එකී කොන්දේසි කිසිවක් කඩ කලොත් හෝ ඔහු කොන්ත්‍රාත්තුව ඉටු නොකළාසේ සළකනු ලැබේ. තවද කොන්ත්‍රාත්තුව ඉටුකරන බවට ඔහු ඇපයක් හැටියට තැන්පත් කළ මුදලද රජය සතුවී, රජයේ කොන්ත්‍රාත්තුවකට හවුල් වීමට ඔහුට ඉඩක් නොලැබෙන පරිදී රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින්නන්ගේ නාමාවලියට ඔහුගේ නමද ඇතුළත්වීමට ඉඩ තිබේ.

20. ලංකාණ්ඩුවේ නීති මේ කොන්ත්‍රාත්තුවට අදාල වෙයි.

21. ටෙන්ඩර්කරුවන් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි හොඳින් දැන සිටිය යුතුයි. තොරතුරු නොදත් බව හෝ ප්‍රමාණවත් නොවූ බව හෝ කියා ඉදිරිපත් කරන මැසිවිලි කිසි කලෙකත් සළකා බලනු නොලැබේ.

22. මෙහි ලා සඳහන් සියලු කොන්දේසි අකුරටම සපුරා නැතහොත් කිසිදු ටෙන්ඩරයක් සළකා බලනු නොලැබේ.

23. ටෙන්ඩර්කරුවන්ට දැන ගැනීමට අවශ්‍ය වැඩි විස්තර යමක් වෙතොත්, ඉහත දෙවැනි ඡේදයේ දක්වෙන කාර්යාලවලින් ඉල්ලා ලබා ගත හැකිය.

24. **දුර ප්‍රමාණ කිට්ටුවෙන්.**—දුම්රියපොලවල අතුරු පොලවල සිට ආයතනවලට/කාර්යාලවලට කොපමණ දුරක් තිබේද යන වග මේ සමග ඇති උපලේඛනයේ දක්වේ. මෙහි දක්වෙන දුර ප්‍රමාණයේ නිරවද්‍යතාවය ගැන දෙපාර්තමේන්තුව වග නොකියයි.

25. **ගබඩා/බඩු යනාදිය නැතිවීම නිසා මුදල් අය කිරීම.**—කොන්ත්‍රාත්කරු විසින් ගෙන ගොස් බාරදිය හෝ ඉන් යමක් හෝ නැතිවූවොත් හෝ සොරකම් කරනු ලැබුවහොත් හෝ බඩු බාහිරාදියට අලාභයක් හානියක් සිදුවුවහොත් හෝ ඒ හේතුවෙන් රජයට දැරීමට හේතුවන රේගු බදු යනාදිය කිසිවක් වෙතොත් එයද ඇතුලත් කොට, අලාභ හානි සිදුවී හෝ සොරකම් කරන ලද හෝ නැතිවූ බඩු බාහිරාදියෙහි මුලු වටිනාකම දෙපාර්තමේන්තු ගාස්තුත් සමඟ දෙපාර්තමේන්තුවට ගෙවීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

26. දැක්විය යුතු මිළ ගණන්.—(අ) (1) බඩු ඇදීම සඳහා මෙසේ වැටි 10 ක් යටතේ එක් එක් බරගොල්ල වෙනුවෙන් මිල ගණන් බී–I උප ලේඛණයෙහි දැක්විය යුතු :—

පලමුවැ රාත්තල් 28 දක්වාද,
දෙවැනුවැ රාත්තල් 28 වැඩියෙන් රාත්තල් 56 දක්වාද,
තුන්වනුවැ රාත්තල් 56 ට වැඩියෙන් රාත්තල් 84 දක්වාද,
සිව්වැනුවැ රාත්තල් 84 ට වැඩි හොණ්ඩර 1 දක්වාද,
පස්වැනුවැ හොණ්ඩර 1 ට වැඩියෙන් හොණ්ඩර $1\frac{1}{2}$ දක්වාද,
හයවැනුවැ හොණ්ඩර $1\frac{1}{2}$ ට වැඩියෙන් හොණ්ඩර 2 දක්වා ද,
හත්වැනුවැ හොණ්ඩර 2 ට වැඩියෙන් හොණ්ඩර $2\frac{1}{2}$ දක්වාද,
අටවැනුවැ හොණ්ඩර $2\frac{1}{2}$ ට වැඩියෙන් හොණ්ඩර 3 දක්වාද,
නමවැනුවැ හොණ්ඩර 3 ට වැඩියෙන් හොණ්ඩර $3\frac{1}{2}$ දක්වාද,
දහවැනුවැ හොණ්ඩර $3\frac{1}{2}$ ට වැඩියෙන් හොණ්ඩර 4 දක්වාද වේ.

(ii) මුදල් ගෙවනු ලබන්නේ ඉහා වැඩි කොටසක් දැක්වෙන මුලු දුර ප්‍රමාණය මැ ගෙන යන ලද එක් එක් බඩු පොදි ගමන අනුවයි.

බී1 හොණ්ඩර 4 ක් හෝ ඊට වැඩියෙන් හෝ බරක් ඇති බඩු තොග මුලු දුරට ගෙන යාම සඳහා මතු සටහන් වැටි 4 යටතේ බී–2 උප ලේඛණයෙහි මිළ ගණන් දැක්විය යුතුයි :—

(1) හොණ්ඩර 4 කට වැඩියෙන් හොණ්ඩර 10 දක්වා
(2) හොණ්ඩර 10 කට වැඩියෙන් හොණ්ඩර 15 දක්වා
(3) හොණ්ඩර 15 කට වැඩියෙන් හොණ්ඩර 20 දක්වා
(4) ටොන් 1 කට වැඩියෙන්

ටෙන්ඩර් කරුවන් විසින් මුලු දුරමගෙන යැම සඳහා ඒ ඒ යටතේ මිල ගණන් වෙන වෙනැම දැක්විය යුතුයි. මුදල් ගෙවනු ලබන්නේ වැටි 4 යටතේ මුලු දුරම සඳහා හොණ්ඩරයකට දැක්වූ මිල ගණන් මතු අනුප්‍රමාන ක්‍රමය උඩයි. හොණ්ඩරයක කොටසක් රාත්තල් 56 කට වැඩිනම් එය හොණ්ඩර යක්සේ සැලකෙයි. නොඑසේ නම් ඊට මුදලක් ගෙවනු නොලැබේ.

සී(i) එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට අඩුවේනම් ඒවායේ ගෙවීම බී 1 උප ලේඛනයේ යටතේ විය යුතුයි.

සී(ii) එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට වැඩිනම් ඒවායේ ගෙවීම බී 2 උප ලේඛණය යටතේ විය යුතුයි.

සී(iii) එක් බඩු තොගය යනුවෙන් මේ වගන්තියෙන් අදහස් වන්නේ දුම්රිය ස්ථානයේදී ඕනෑම දිනයක කොන්ත්‍රාත්කරුට බෙදා හැරීම පිණිස බාරදෙන ලද මුලු බඩු ප්‍රමාණය හා ඕනෑම දිනයක දුම්රිය ස්ථානය වෙත ගෙන යැම පිණිස ආයතනවලින් භාරදෙන ලද මුලු බඩු ප්‍රමාණයයි.

ඩී. සඳහන් කර ඇති මිළ ගණන් සාධාරනතා විය යුතු අතර යාබද බඩු භාණ්ඩ අතර අනවශ්‍ය පරිදි මිල වැඩිවිය යුතු නොවේ.

27. මේ දැන්වීම, මෙහි පහත ඉඩ තබා ඇති තැනෙහි ටෙන්ඩර්කරුගේ අත්සන තබා ටෙන්ඩර් පත්‍රත් සමග රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරි වෙත ආපසු එවිය යුතුයි.

වී. ඩී. ටී. ද සිල්වා,
රජයේ සෞඛ්‍ය සේවා අධිකාරි.

————————,
නියුක්තකරන නිලධාරියාගේ අත්සන

දිනය :

————————,
ටෙන්ඩර්කරුගේ අත්සන.

දිනය :

**1972–73 ගබඩා බඩු ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් කොන්දේසිවල 24 ඡේදයේ කියැවෙන උපලේඛනය**

රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාශය

රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරි/දුම්රිය පොලෙන්/පොලට/ආයතනවලින්/කාර්යාලවලින්/ආයතනවලට/කාර්යාලවලට දුර ප්‍රමාණය දළ වශයෙන්.

I වන කොටස—රත්නපුර කොට්ඨාශය

| දුම්රිය පොලෙන් ආයතනවලින්/ආයතනවලට පොලට/ස්ථානයට කාර්යාලවලින්/කාර්යාලවලට | | කිට්ටුවෙන් සැළකිය යුතු දුර සැතපුම් |
|---|---|---|
| ඇහැලියගොඩ ... | ර.රෝහල, ඇහැලියගොඩ ... | $\frac{1}{4}$ |
| | සෞ. කා. ඇහැලියගොඩ ... | $\frac{1}{2}$ |
| | ප.බෙ. ශාලාව, කිරිපෝරුව ... | 6 |
| | පා.දු. චිකිත්සාගාරය, ඇහැලියගොඩ... | $\frac{1}{4}$ |
| කුරුවිට ... | ප.බෙ. ශාලාව, කුරුවිට ... | 1 |
| | ගැමි රෝහල, එරත්න ... | 7 |
| ගැටහැත්ත ... | ම.බෙ. ශාලාව, නාපාවල ... | 4 |
| රත්නපුර ... | පළ රෝහල, රත්නපුර ... | $1\frac{1}{4}$ |
| | සෞ.වෛ.නි. කාර්යාලය, රත්නපුර | $\frac{1}{2}$ |
| | සෞ.සේ.අධි. කාර්යාලය, රත්නපුර ... | $\frac{1}{2}$ |
| | ම.බෙ.හල සහ මා.නි. කිරිඇල්ල ... | 12 |
| | ම.බෙ. හල සහ මා.නි. ගල්ලැල්ල ... | 10 |
| | ගැමි රෝහල, ගිලීමලේ ... | $9\frac{1}{4}$ |
| | ම.බෙ ශාලා සහ මා.නි. අයගම ... | 20 |
| | ම.බෙ. ශාලාව, දෙල්ලබොඩ ... | 12 |
| | ලය චිකිත්සාගාරය, රත්නපුරය ... | $1\frac{1}{2}$ |
| | ම.බෙ. ශාලා, තෙප්පනාව (නව ගොඩනැගිල්ල) ... | 12 |
| | පා.දු. චිකිත්සාගාරය, රත්නපුරය ... | $\frac{1}{2}$ |
| | ප්‍රාදේශීය බෙහෙත් ගබඩාව ... | $\frac{1}{2}$ |
| පාදුක්ක ... | ම.බෙ. ශාලාව, ඇල්ලගාව ... | 11 |
| | කොටස "බී" | |
| දූල ... | ප.ඒකකය, කලවාන ... | 17 |
| | ම.බෙ. හල, නිවිතිගල ... | 5 |
| | ප.දු. චිකිත්සාගාරය, කලවාන ... | 15 |
| කහවත්ත ... | ර.රෝහල, කහවත්ත ... | $\frac{1}{2}$ |
| | ම.බෙ. හල, ඔමල්පෙ ... | 43 |
| | ර.රෝහල, ඇඹිලිපිටිය ... | 31 |
| | ර. රෝහල, කොලොන්න ... | 32 |
| | ගැමි රෝහල, ගොඩකවෙල ... | 9 |
| | ම. බෙ. හල, මුල්ලේන්ඩියාවල ... | 42 |
| | ම. බෙ. හල, පැල්මඩුල්ල ... | 4 |
| | ගැමි රෝහල, පනාමුපිටිය ... | 26 |
| | ර. රෝහල, රක්වාන ... | $12\frac{1}{2}$ |
| | මා.නි. රන්විල ... | 21 |
| | ර. රෝහල, පල්ලෙබැද්ද ... | 15 |
| | සෞ. කාර්යාලය, අටකලන්පන්න ... | 5 |
| | චන්ද්‍රිකා වැව ර.රෝ. පැලහෙල ... | 37 |
| | පා. දු. චිකිත්සාගාරය, රක්වාන ... | 12 |
| | ර. රෝහල, බලන්ගොඩ ... | 11 |
| | ප. දු. චිකිත්සාගාරය, විජේරිය ... | 26 |
| ඔපනායක ... | සෞ. වෛ. නි. කාර්යාලය, බලන්ගොඩ ... | 9 |
| | ම.බෙ. හල, බෙලිහුල්ඔය ... | 18 |
| | ර. රෝහල, කල්තොට ... | $27\frac{1}{2}$ |
| | මා.නි. මහවලතැන්න ... | 17 |
| | ගැමි රෝහල, වැලිගෙපොල ... | 18 |
| | ම.බෙ. හල, පින්නවල ... | 18 |
| | ම.බෙ. හල (නව ගොඩනැගිල්ල) උඩවෙල ... | 2 |
| | ප.දු. චිකිත්සාගාරය, බලංගොඩ ... | 10 |

9–703/3—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

ජාතික කිරි ව්‍යාපාරය—කිරිපිටි සහ සීනි එහා මෙහා ගෙනයාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුනම් ඇති පුද්ගලයන් සහ සේවා.**—වර්ෂ 1974 ජනවාරි 1 සිට 1974 දෙසැම්බර් 31 වැනි දින දක්වා (දෙදින ඇතුලුව) කාලය තුල මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ ගබඩාවලට දුම්රියපලවල සිට කිරිපිටිත්, සමුපකාර සංගම්වල සිට සීනිත් එම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ ගබඩාවල සිට කිරි මධ්‍යස්ථානවලට එම කිරිපිටි සහ සීනි ගෙනයැම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික සමාගම් විසින් වෙන වෙනම එවනු ලැබූ සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල් තැන්පත් කිරීම.**—රුපියල් 100 ක තැන්පත් මුදලක් මා නමට ඕනෑම කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු අනුරාධපුරය, මඩකලපුව, බදුල්ල, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, වවුනියාව හෝ රත්නපුර යන ස්ථානවල සෞඛ්‍ය සේවා අධිකාරින්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. නියමිත පෝරමයේ නොවන වෙනත ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කර ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය. ටෙන්ඩර්කරුවන්ට පෝරම ලබාගෙන ඒවා අවසාන දිනයේදී නියමිත වෙලාවට පෙර ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොදරන අය ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පෙර සැලකිය යුතු කාලයකට පළමුව තම වත්කම ගැන හෝ කරා ටෙන්ඩර් පෝරම ලබාගැනීමට අදහස් කරන සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දන්විය යුතුය. මේ සඳහා පෝරම දෙවන ඡේදයේ (ii) වන කොටසෙහි සඳහන් ඕනෑම කාර්යාලයකින් ලබාගත හැකිය. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවිට හෝ මුදල් තත්වය විදහාපෑමට කරුණු ඉදිරිපත් කරන ලෙය දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **සැපයිය යුතු කිරිපිටි ප්‍රමාණයන්.**—සැපයිය යුතු කිරිපිටි සහ සීනි ප්‍රමාණයන් දළ වශයෙන් මේ සමඟ ඇති උපලේඛනයෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරි නමට ලියන ලද කවරයක බහා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි එය කවර සේවාවක් සඳහාද යන වගත් වම්පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයත් පැහැදිලිව සඳහන් කළ යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් බහාලන කවරය මෙම කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කිරීමට හෝ ලේඛන ගත තැපෑලෙන් එවීමට හෝ මෙම කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්/ගණකාධිකාරිතැනගේ අතට භාරදී එය ලැබුණු බවට ඔහුගෙන් කුවිතාන්සියක් ලබාගැනීමට හෝ පිළිවන.

6. **ටෙන්ඩර් බාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ 4 වැනි තීරුවේ සඳහන් දින පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම මෙම කාර්යාලයේදී අවසානවූ විගාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට ඒ ඒ ස්ථානයේ පැමිණ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන්කර ඇති මිළ ගණන් ද එසේ පෙනී සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් පත්‍රයක් පරීක්ෂා කිරීමට අවශ්‍යයයි සිතෙන්නෙහි නම් මා හෝ මගෙන් බලයලත් නියෝජිතයෙකු සමඟ හෝ විධිවිධාන යොදගෙන ඉදිරිපත් කරන ලද ටෙන්ඩරයෙහි දෙවන පිටපත පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන්ව ඇති කොන්ත්‍රාත්තුවේ කාලය තුළ වලංගු වේ. මේ කොන්ත්‍රාත්තුව අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයේ විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් කවර හේතුවක් නිසාවත් වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

9. **ඇප මුදල් තැන්පත් කිරීම.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු ඇප මුදල තැන්පත් කිරීමෙන් පසුව පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන අය එහි අඩංගු කොන්දේසි හොඳින් කියවා බලා දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර මෙම කාර්යාලයෙන් ඉල්ලුම් කොට ලබාගත හැක.

**වී. ඩී. ටී. ද සිල්වා,**
**රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරී.**

**1973 සැප්. 14** වෙනි දින,
රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දීය,

උපලේඛනය

| | සේවය | ප්‍රදේශය | දෙමාසයකට වතාවක් සැපයිය යුතු දළ ප්‍රමාණය කිරි රා. | පිටි හො. | අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| 1. | රත්නපුර දුම්රිය පොලේ සිට කිරිපිටිත් රත්නපුර විවිධසේවා ප්‍රාථමික සමුපකාර සමිතියේ සිට සීනිත් රත්නපුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට සහ එම කාර්යාලයේ සිට එම සෞඛ්‍ය ප්‍රදේශය සහ ඇහැලියගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ ප්‍රදේශයේ කිරි මධ්‍යස්ථාන වලට | රත්නපුර ... | 25 ... | 10 ... | 1973.10.16 පෙ.ව. 10.00ට |
| 2. | කහවත්ත දුම්රිය පොළේ සිට කිරිපිටිත් අටකලන් විවිධ සේවා සමුපකාර සමිතියේ සිට අටකලන්පන්නේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයටත් එම ස්ථානයේ සිට එම සෞඛ්‍ය ප්‍රදේශයේ කිරි මධ්‍යස්ථාන වලට | අටකලන්පන්න ... | 25 ... | 9½ ... | එම |

9-703/4—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

අයිතිකරු නොකියන ලද මෘත ශරීර අස්කිරීම හා වැළලීම—රත්නපුර මහ රෝහල

වර්ෂ 1974 ජනවාරි 1 වැනි දින සිට 1974 දෙසැම්බර් 31 වැනිදා දක්වා (දින දෙකම ඇතුළුව) කාල පරිච්ඡේදය තුළ මේ සමග ඇති උපලේඛනයේ පළමු වැනි තීරුවෙහි දක්වා ඇති පරිදි රත්නපුර රෝහලේ අයිතිකරු නොකියන ලද මෘත ශරීර අස්කිරීම හා වැළලීම සඳහා එවනු ලැබූ සීල් තබනලද ටෙන්ඩර් පත්‍ර ලාංකිකයන්ගෙන් හෝ ලාංකික ආයතනවලින් රත්නපුර, සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. මෙම කාර්යාලය මඟින් සපයන ලද පෝරමවල පමණක් පිටපත් දෙකකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. මේ සමඟ ඇති උපලේඛනයේ 4 වැනි තීරයෙහි සඳහන් දිනවල පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් විසින් ටෙන්ඩර් පත්‍රවල සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර් කරුවෙකුට ටෙන්ඩර් පත්‍ර පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් මගේ හෝ මවිසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

4. මේ සමග ඇති උපලේඛනයේ 2 වැනි තීරයෙහි සඳහන් ප්‍රමාණයේ මුදලක් මගේ නමට කච්චේරියක මුදල් තැන්පත් කළ බවට නිකුත් කරන ලද කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍ර ලබාගැනීමම පළමුව ඉදිරිපත් කළ යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරනලද සමුපකාර සමිති ඇතුළත් සංගම හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැකිය. එසේ හෝ වෙවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

5. අයදුම්කරුවන් විසින් තැන්පත් කරන ලද මුදලට ලබාගත් කුවිතාන්සිය ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පෙර දින දවල් 12 ට පෙර ඉදිරිපත් කර අවශ්‍ය ෆෝරම ලබා ගත යුතුයි. තැපැලෙන් ටෙන්ඩර් ෆෝරම ඉල්ලුම් කරන අය මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල් වේලා ඇතිව එවීමෙන් අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් එවීම සඳහා අවශ්‍ය ෆෝරම ලබා ගත හැකිය.

6. සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර්පත්‍ර ඉල්ලා එවීමට පෙර තම තමන්ගේ වටිනාකම පිළිබඳ තොරතුරු මා වෙත දන්විය යුතුයි. මේ සඳහා අවශ්‍ය ෆෝරම මෙම කාර්යාලයෙන් හෝ දිවයිනේ අනිකුත් සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලවලින් ලබා ගත හැක. ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිර භාවය පිළිබඳ තොරතුරු දැන ගැනීමට පෙර ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් පිළිබඳව තීරණයක් කල නොහැකි බැවින් තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු කල් වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුයි.

7. සෑම ටෙන්ඩරයක්ම රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරී තැනගේ නමට එවිය යුතුයි. සීල් තැබූ ටෙන්ඩර් පත්‍රය බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා ද යන්න සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ කොන්ත්‍රාත් පිළිබඳ ගණකාධිකාරිවරයාට පුද්ගලිකව භාර දී හෝ ලැබුණු බවට කුවිතාන්සියක්ද ලබා ගත හැක. ටෙන්ඩර්කරුවන්ට තම ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපැලෙන් එවීමට පිළිවන. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දින පෙරවරු 10 ට පසු තැපැලෙන් එවන හෝ පැමිණ භාර දෙන සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටු පස දක්වා ඇත. ටෙන්ඩරයක් ඉල්ලුම් කරනවිට එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම ඒවා පිළිපැදිය යුතු ද වන්නේය.

9. කිසිම ගිවිසුමක් නොමැතිව ටෙන්ඩරය සම්පූර්ණයෙන් හෝ කොටසක් භාර ගැනීම ද නැතහොත් සියලුම ටෙන්ඩර් හෝ කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ බලය රජය සතුව ඇත.

10. වැඩි විස්තර මේ කාර්යාලයට අයදුම්පතක් එවීමෙන් දැනගත හැකිය.

වෛද්‍ය. වී. ඩී. ටී. ද සිල්වා,
රත්නපුර, සෞඛ්‍ය සේවා අධිකාරි.

1973 සැප්තැම්බර් 14 වෙනි දින,
රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදීය.

**උප ලේඛනය**

| (1) සේවය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. ශ. | (3) ඇප මුදල රු. ශ. | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|
| අයිතිකම් නොකිය ලද මෘත ශරීර අස් කිරීම හා වැලලීම—රත්නපුර මහ රෝහල | ... 100 0 | ... 100 0 | ... 1973.10.16 පෙ.ව. 10.00ට |

9–703/5—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—බදුල්ල කොට්ඨාශය**

**කිලිටි රෙදි සේදීම—1974**

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1974 ජනවාරි 1 වෙනි දින සිට 1974 දෙසැම්බර් 31 වෙනිදයින් (දින දෙකත් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවැනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර බදුල්ල සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ 2 වන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම කරන විට ඒ ඒ සමාගම්වල හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ෆෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ෆෝරම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ෆෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි ෆෝරම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුය.

3. **වත්කම් විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ෆෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් ෆෝරම ලබා ගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා ෆෝරම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක. වත්කම් විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වෙනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ,' සෞඛ්‍ය සේවා අධිකාරි, බදුල්ල '' කියා එවිය යුතුයි. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි/ලේකම් මහතාට (හෝ මා හට) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු හෝ මා විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 වෙනි තීරුවේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත්කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු ප්‍රතිඥලය භාරගැනීම හෝ ම විසින් බලය පවරනු ලැබූ නියෝජිත යෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායෙහි පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවෘ ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ අඩු වැඩි කිරීමට ඉඩදෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිළධාරිතුමා තක්සේරු කළ ගණන් වලට අනුව වටුවරයෙන් කපාගනු ලැබේ.

(ii) **කිළිටි රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙනයෑමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩල තුළ ඇති නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරියිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

ඒ. සී. එස්. ජයසිංහ,
නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධිකාරි.

1973 සැප්තැම්බර් මස 11 වැනි දින,
සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
බදුල්ල.

උප ලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) මසකට රෙදි සේදිය යුතු වාර ගණන | (5) මසකට රෙදි සේදිය යුතු කෑලි ගණන සාමාන්‍යයෙන් | (6) ටෙන්ඩර් භාරගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | | | |
| බදුල්ල රෝහල—"ඒ" කොටස : | | | | | |
| වාට්ටු අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, 12, 14, 15, 18, 19 හා 20 භික්ෂු වාට්ටුව, දත් චිකිත්සාගාරය, ඇස් චිකිත්සාගාරය, සමාජ රෝග චිකිත්සාගාරය, වෛද්‍ය චිකිත්සාගාරය, විකලාංග චිකිත්සාගාරය, ඩිස්පැන්සරිය, බාහිර රෝගීන්ගේ අංශය, ඇක්ස්රේ, මුළුතැන්ගෙය, ලේ බැංකුව, රසායනාගාරය | 50 0 ... | 300 0 ... | 4 (දින හතකට වරක්) ... | 5,000 ... | 1973.10.13 පෙ.ව. 10 ට |
| "බී" කොටස (i) ශල්‍යාගාරය ... | 50 0 ... | 400 0 ... | 15 (දින 2කට වරක්) ... | 9,500 ... | එම |
| "බී" කොටස (ii) වාට්ටු අංක 9, 10, 11, 13, 16, 17ඒ සහ 17බී | 50 0 ... | 400 0 ... | 15 (දින 2කට වරක්) ... | 9,800 ... | එම |

9–736—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ කොට්ඨාශය

කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1974.1.1 සිට 1974.12.31 වනද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමඟ ඇති උප ලේඛණයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සිල් තබන ලද ටෙන්ඩර්පත් කොළඹ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී, සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උප ලේඛණ යේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම් වලට අයිති සමිති වලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි වරුන්ගේ කාර්යාල වලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්ම යේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර්පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සෑළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර්පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙණෙන දෙවන ඡේදයේ (ii) කොටයෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමග ඇති උප ලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවියයුතු අන්දම.**—සියලුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරි, කොළඹ" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළයුතුවාක් මෙන්ම එහි වම්පස කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැළැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර්සත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙණෙන උප ලේඛනයේ 4වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### අංගොඩ මානසික රෝහලට දර සැපයීම

1974 ජනවාරි මස 1 වැනිද සිට 1974 දෙසැම්බර් මස 31 වැනිදයින් අවසන් වන වර්ෂය තුළ මේ සමඟ ඇති උපලේඛනයේ පළමුවැනි තීරයෙහි දක්වා ඇති දර සැපයීම සඳහා එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර ලාංකිකයන්ගෙන් හෝ ලාංකික ආයතනවලින් අංගොඩ මානසික සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. මෙම කාර්යාලය මඟින් සපයන ලද පෝර්මවල පමණක් පිටපත් දෙකකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. මේ සමඟ ඇති උපලේඛනයේ 4 වන තීරයෙහි සඳහන් දින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් විසින් ටෙන්ඩර් පත්‍රවල සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් පත්‍ර පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් මානසික සෞඛ්‍ය සේවා අධිකාරි හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

4. මේ සමඟ ඇති උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් ප්‍රමාණයේ මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට නිකුත් කරන ලද කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට පළමුව ඉදිරිපත් කළ යුතුයි.

අනුමත කරන ලද ග්‍රාමසංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ එවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලි සඳහන් කළ යුතුය.

5. අයදුම්කරුවන් විසින් තැන්පත් කරන ලද මුදලට ලබාගත් කුවිතාන්සි ටෙන්ඩර් පත්‍ර නිකුත් කරන දිනට පෙර දින දවල් 12ට පෙර ඉදිරිපත් කර අවශ්‍ය පෝර්ම ලබාගත යුතුයි. තැපැලෙන් පෝර්ම ඉල්ලුම් කරන අය මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල් වේලා ඇතිව එවීමෙන් අවසාන දිනයට ප්‍රථම ටෙන්ඩර් එවීම සඳහා අවශ්‍ය පෝර්ම ලබාගත හැකිය.

6. සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලා එවීමට ප්‍රථම තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු මානසික සෞඛ්‍ය සේවා අධිකාරි වෙත දන්විය යුතුය. මේ සඳහා අවශ්‍ය පෝර්ම එම කාර්යාලයෙන් ලබාගත හැකිය.

ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිර භාවය පිළිබඳ තොරතුරු දැනගැනීමට පෙර ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් පිළිබඳ තීරණයක් කළ නොහැකි බැවින් තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු කල් වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුය.

7. සෑම ටෙන්ඩරයක්ම ඉහත සඳහන් මානසික සෞඛ්‍ය සේවා අධිකාරීතැනගේ නමට එවිය යුතුයි. සීල් තැබූ ටෙන්ඩර් පත්‍රය බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් ද යන්න සඳහන් කළ යුතුයි. ඒ කවරයේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් පත් එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලේකම්වරයාට එය පුද්ගලිකව භාර දීමෙන් හෝ එය ලැබුණ බවට කුවිතාන්සියක් ද ලබාගත හැක. ටෙන්ඩර්කරුවන්ට තම ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපැලෙන් ද එවීමට පුළුවන.

ටෙන්ඩර් භාරගන්නා අවසාන දින පෙ.ව. 10ට පසු තැපැලෙන් එවන හෝ පැමිණ භාර දෙන සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. මෙම ආයතනය සඳහා සැපයිය යුතු දර ප්‍රමාණය දළ වශයෙන් ආයතනය භාර වෛද්‍ය නිලධාරි තුමාගෙන් හෝ මෙම කාර්යාලයෙන් ලබාගත හැකිය.

9. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර් ඉල්ලුම් කරන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු ද වන්නේය.

10. කිසිම විමසුමක් නොමැතිව ටෙන්ඩරය සම්පූර්ණයෙන් හෝ කොටසක් භාර ගැනීමද නැතහොත් සියලුම ටෙන්ඩර් හෝ කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ බලයද රජය සතුව ඇත.

11. වැඩි විස්තර මෙම කාර්යාලයට අයදුම්පත් එවීමෙන් දැනගත හැකිය.

ඒ. ටී. සමරසේන,
මානසික සෞඛ්‍ය සේවා අධිකාරි.

මානසික සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
අංගොඩ,
1973.09.10 දින.

#### උපලේඛනය

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|
| ආයතනයේ නම | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල (රු. ශ.) | ඇප මුදල (රු. ශ.) | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව |
| අංගොඩ මානසික රෝහලට දර සැපයීම ... | 50 0 ... | 300 0 ... | 1974 ඔක්තෝබර් මස 9 දින පෙ. ව. 10ට |

9-772—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

### 1974 මුදල් වර්ෂය තුල කොළඹ (වැලිකඩ, කොළඹ රිමාන්ඩ් සහ මැගසින් බන්ධනාගාර) මහනුවර (බෝගම්බර සහ මහනුවර රිමාන්ඩ් බන්ධනාගාර) මහර, වතුපිටිවල සහ කුංඩසාලේ බන්ධනාගාරවලට කෑම ද්‍රව්‍ය සැපයීම

ඉහත සඳහන් බන්ධනාගාරවලට 1974 ජනවාරි 1 වෙනි දින සිට 1974 දෙසැම්බර් 31 දින දක්වා කෑම ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් මිළ ගණන් ඉදිරිපත් කළ යුත්තේ, " වෙළඳ ද්‍රව්‍ය " වශයෙන් මිස " ආහාර " ක්‍රමයට නොවේ. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට කැමති යම් උපලේඛනයට හෝ උපලේඛනයන්හි ඉහත සඳහන් සියලුම විෂයයන් සඳහා මිළ ගණන් ඉදිරිපත් කළ යුතුය. ආ සිට ඊ දක්වා සඳහන් උපලේඛනයන්ගෙන් ඕනෑම එකකට හෝ වැඩි ගණනකට මිළ ගණන් ඉදිරිපත් කිරීමට පුළුවන. ඒ ඒ උපලේඛනය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් භාරගැනීමේ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතුය. සැපයිය යුතු ද්‍රව්‍ය පහත එන උපලේඛනයන්ගෙන් බලාගත යුතුයි :—

උපලේඛනය (ආ)

හරක් මස්
එළු මස්
ලිවර්
කුකුලු මස්
බිත්තර

උපලේඛනය (ඇ)

පොල්, තැඹිලි

උපලේඛනය (ඊ)

(අ) කොළ එළවලු
(ආ) පළතුරු එළවලු
(ඇ) පිටි සහිත එළවලු
(ඈ) අන්‍ය එළවලු

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### 1974 කෑම ද්‍රව්‍ය සැපයීමට ටෙන්ඩර් කැඳවීම

1974 මුදල් වර්ෂය තුළ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ආයතනවලට කෑම ද්‍රව්‍ය සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් (''ලාංකික'' යනුවෙන් අදහස් කරන්නේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියන් වූවෙකි) ටෙන්ඩර් කැඳවනු ලැබේ. කෑම ද්‍රව්‍ය සැපයිය යුතු කාලසීමාව 1974.1.1. සිට 1974 12.31 දක්වාය.

| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා විවෘත කරන දිනය |
|---|---|---|---|
| | රු. | රු. | |
| මීගමුව බන්ධනාගාරය ... ... ... ... ... | 50 ... | 1,000 ... | 16.10.1973 |
| එළිමහන් සිරකඳවුර, කෝප්පායි (යාපනය) ... ... ... ... | 50 ... | 500 ... | 16.10.1973 |
| එළිමහන් අභ්‍යාස විද්‍යාලය, තල්දෙන (බදුල්ල) ... ... ... ... | 50 ... | 500 ... | 16.10.1973 |
| බදුල්ල බන්ධනාගාරය ... ... ... ... ... | 50 ... | 1,000 ... | 16.10.1973 |
| මඩකලපුව බන්ධනාගාරය ... ... ... ... ... | 50 ... | 1,000 ... | 16.10.1973 |
| අනුරාධපුරය බන්ධනාගාරය ... ... ... ... ... | 50 ... | 1,000 ... | 17.10.1973 |
| ගාල්ල බන්ධනාගාරය ... ... ... ... ... | 50 ... | 1,000 ... | 17.10.1973 |
| මාතර බන්ධනාගාරය ... ... ... ... ... | 50 ... | 1,000 ... | 17.10.1973 |
| තංගල්ල බන්ධනාගාරය ... ... ... ... ... | 50 ... | 500 ... | 17.10.1973 |
| අලුත්කඩේ බන්ධනාගාරය ... ... ... ... ... | 50 ... | 1,000 ... | 17.10.1973 |

ආහාර සඳහා ගණන් ඉදිරිපත් කිරීමේදී බත්, පාන්, තේ, සීනි, පරිප්පු, සුදුරු සහ කොත්තමල්ලි යන ද්‍රව්‍යයන් ඇතුලත් නොකොට ගණන් ඉදිරිපත් කළ යුතු බව හා (සියලුම ආයතනයන් සම්බන්ධයෙන් බත්, පාන්, තේ, සීනි, පරිප්පු, සුදුරු සහ කොත්තමල්ලි ආදී ද්‍රව්‍යයන් අත්හැරීමෙන් ආහාර මිශ්‍රණයේ වෙනස් කම් ඇති කර ඇති බව ද, අනුරාධපුරය, කෝප්පායි, බදුල්ල, තල්දෙන සම්බන්ධයෙන් එළවළු අත්හැරිය යුතු බව ටෙන්ඩර්කරුවන් විසින් විශේෂයෙන් දැනගත යුතුව ඇත). අනුරාධපුරය, ගාල්ල, තංගල්ල යන බන්ධනාගාර සම්බන්ධයෙන් මාලු ද අත්හැර ගණන් ඉදිරිපත් කළ යුතුය.

3. එක් ආයතනයක් සඳහා සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක බහා සීල් තබා '' සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, කොළඹ 9 '' කියා එවිය යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවා විසින් හෝ ඔහුගේ නියෝජිතයකු විසින් හෝ කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ මූලස්ථාන අධිකාරි ජේ. පී. දෙල්ගොඩ මහතාට භාර දී එය ලැබුණු බවට ලියවිල්ලක් ලබාගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහා ලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ '' ...... ආහාර ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩරය '' කියා ලියා මෙහි 1 වැනි වගන්තියේ සඳහන් ඒ ඒ දිනවල පෙරවරු 10.30 ට ප්‍රථම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයාට ලැබෙන සේ එවිය යුතුයි. මෙහි 1 වැනි වගන්තියේ සඳහන් ඒ ඒ දිනවල පෙරවරු 10.35 ට කොළඹ 9, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයාගේ කාර්යාලයේදී (බන්ධනාගාර මූලස්ථානය) ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

6. ටෙන්ඩර් පෝර්ම කොළඹ 9, බේස්ලයින් පාරේ පිහිටි බන්ධනාගාර කොමසාරිස් වරයාගේ ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත හැක. නියමිත පෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ. එක් එක් බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ ඒ ඒ බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට (ඉහත 1 වැනි ඡේදය බලන්න.) පෙර දින පස්වරු 2.00 දක්වා පමණි.

7. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වූ දින සිට මාස 3 ක් යන තුරු ටෙන්ඩර්කරුවන් තමන්ගේ ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

8. ටෙන්ඩර්වල සියලුම වෙනස් කිරීම් හා මැකීම්වලට ටෙන්ඩර් කරුවන් විසින් තම කෙටි අත්සන තැබිය යුතුයි.

9. මෙහි පහත සඳහන් පරිදි, ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් මුදල් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ කොළඹ කච්චේරිය හැර වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සි ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10 ක් ඇතුළත දී අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීමට නුපුළුවන් විනි නම් හෝ එසේ කිරීමෙන් වැලකී සිටිනම් හෝ තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවා ඇත. ඉන් පසු රජය සම්බන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකි වන සේ ඔහුගේ නම කොන්ත්‍රාත් කඩකරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත. තව ද, කොන්ත්‍රාත් කඩකිරීමේ අලාභ වශයෙන් ලංකාවේ වලංගු මුදලින් රු. 3,000 ක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම කොන්ත්‍රාත්කරුවන්ට සිදුවෙනවා ඇත. මෙම මුදල අලාභ වශයෙන් නීති මාර්ගයෙන් අයකරගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස් වෙත පැවරී ඇත.

ටෙන්ඩරය පිළිගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙනු ලබන ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත්, හෝ නොඑසේව එහි ගෙන ගොස් භාර දුනහොත් එම නිවේදනය ටෙන්ඩර්කරුවා වෙත ලැබුනු ලෙස සලකනු ලැබේ. අනාය සියළු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

10. එක් එක් බන්ධනාගාරයේ එක් එක් උපලේඛන සඳහා තැන්පත් කරනු ලබන මුදල් වෙනුවෙන් වෙන වෙනම කුවිතාන්සි ලබා ගත යුතු බවත්, ඉදිරිපත් කරනු ලබන ගණන් ඉලක්කමින් මෙන් ම වචනයෙන් ද සඳහන් කළ යුතු බවත්, එසේ එම ගණන් වචනයෙන් සඳහන් නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂේප විය හැකි බවත් ටෙන්ඩර්කරුවන්ගේ විශේෂ සැලකිල්ලට භාජන කරවනු ලැබේ.

11. ටෙන්ඩරය පිළිගැනීමෙන් පසු එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවන්, කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටු කරන වගට, ඇප කරුවන් වශයෙන් ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට කැමති වගකිවයුතු පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුයි.

12. ඒ ඒ කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටු කරන වගට අවශ්‍ය තරම් ඇප කරුවන් පොරොන්දු පත්‍රයකින් බැඳීම අවශ්‍ය ය. තැන්පත් කිරීමට අවශ්‍ය ඇප මුදල් ප්‍රමාණය මෙම නිවේදනයේ 1 වැනි වගන්තියේ සඳහන් ප්‍රකාරය. ඒ ඒ බන්ධනාගාර අධිකාරි තැනගෙන් කොන්ත්‍රාත්තුව හරියාකාර කිරීමට වුවමනා කරන සියලු තොරතුරු දැනගත හැකිය.

13. ඒ ඒ ටෙන්ඩරය සඳහා වන සියලු කොන්දේසි සම්පූර්ණයෙන් ඉටුවී නොමැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ගැන සලකා බලනු නොලැබේ.

14. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හෝ සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කිරීමේ හා ඕනෑම ටෙන්ඩරයක් කොටස් වශයෙන් පිළි ගැනීමේ අයිතිවාසිකම් මුළුමණින්ම ටෙන්ඩර් මණ්ඩලය වෙත තබාගනු ලැබේ.

15. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් අනෙකෙකු වෙත පැවරීම හෝ බදු වශයෙන් දීම හෝ කළ නොහැක. කොන්ත්‍රාත්කරුවෙකු වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේ බලය යම් පුද්ගලයෙකු වෙත පවරමින් නිකුත්කරන ලද ඇටෝර්නි බලය පිළිනොගෙන ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය රජය සතුය.

16. ඒ ඒ බන්ධනාගාර අධිකාරින්ට සෑහෙන තරම් කරුණු ඇත්නම් කිසියම් පුද්ගලයෙකු කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යෙදවීම ගැන තම විරුද්ධත්වය ලියා දනුම් දිය හැක. එවැනි කිසිම පුද්ගලයෙකු කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි නොයෙදවිය යුතුය. කොන්ත්‍රාත්තුව ඉටුකිරීමේ දී කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

17. (අ) මීට ප්‍රථමයෙන් රජයේ කොන්ත්‍රාත්තුවක් භාර නොගත් ටෙන්ඩර්කරුවෙක් ටෙන්ඩර් පත්‍ර ඉල්ලා සිටීමේ දී තමාගේ සම්පූර්ණ නම, ස්ථිර ලිපිනය, තමන්ට අයිති දේපොළ ආදිය පිහිටි දිස්ත්‍රික්කය හෝ කොට්ඨාශය සඳහන් කොට, තමා පදිංචි පළාතේ ආදායම් පාලක තැන විසින් සහතික කරනලද වාර්තාවක් ටෙන්ඩර් පෝරම දෙනු ලබන නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුයි. ඉඩකඩම් හා දේපොළවල ප්‍රමාණය හා වටිනාකම එහි සඳහන් කළ යුතුයි.

(ආ) මීට ප්‍රථම මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් කොන්ත්‍රාත්තු ඉටු කරන ලද ටෙන්ඩර්කරුවන්, එසේ සේවය ඉටු කරන ලද්දේ, දැනට ටෙන්ඩර් කැඳවන දිස්ත්‍රික්කයේ හෝ කොට්ඨාශයේ හෝ සඳහා නොවේ නම්, තමන් විසින් එසේ කොන්ත්‍රාත්තුව ඉටුකරන ලද පළාත් හෝ දිස්ත්‍රික්ක සඳහන් කළ යුතුයි.

(ඇ) වෙන දෙපාර්තමේන්තුවකට කොන්ත්‍රාත්තු ඉටු කරන ලද ටෙන්ඩර්කරුවන්, එම දෙපාර්තමේන්තුවේ නම සහ තමා සේවය කළේ කුමන දිස්ත්‍රික්කයේ ද යන වග සඳහන් කරමින් ඒ බවට එම දෙපාර්තමේන්තුවෙන් ලබාගත් ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතුයි.

18. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස් වරයා සමඟ කොන්ත්‍රාත්තුවට අත්සන් තැබිය යුතුයි. එබඳු නිලධාරියෙකුගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේ ද, ගිණිය යුත්තේ ද, ලංකාණ්ඩුව යටතේ දැනට එම පදවිය දරන්නා වූ නිලධාරියා ද, ඔහුට පසුව එම පදවිය දරන්නා වූ නිලධාරියා ද වේ.

19. මේ පිළිබඳව වැඩි විස්තර බන්ධනාගාර මූලස්ථානයෙන් ලබාගත හැක.

ඒ. ඒ. ද සිල්වා,
වැඩබලන බන්ධනාගාර කොමසාරිස්.

1973.09.18,
කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

9-744/2—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

**බන්ධනාගාර දෙපාර්තමේන්තුව**

**1974 වර්ෂය තුළ පාන් සැපයීම**

මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන බන්ධනාගරවලට පාන් සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් (ලාංකික යනුවෙන් හැඳින්වෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් පුරවැසිකම ලද්දෝයි) 1973.10.19 දින පෙරවරු 11 දක්වා බන්ධනාගාර අධිකාරි විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පියවා මිනිත්තු පහකට පසු, එනම් පෙරවරු 11.05 ට ටෙන්ඩර් විවෘත කරනු ලබනවා ඇත. ඒ වේලාවේදී එහි පෙනී සිටීමට ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන්, ද්‍රව්‍ය සැපයීම සඳහා මිළ ගණන් ඉදිරිපත් කිරීමේ දී ඉලක්කමින් මෙන්ම වචනයෙන් ද ඒවා සඳහන් කළ යුතුව ඇත. ඉලක්කමින් සඳහන් කොට ඇති මිළ ගණන් වචනයෙන් සඳහන් කිරීමේදී අසමානත්වයක් ඇතිවී තිබුණහොත් හෝ මිළ ගණන් වචනයෙන් සඳහන් වී නොමැති නම් හෝ එබඳු ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ ඇත්තේ ය.

3. සැපයීම පිළිබඳ විස්තර පහත සඳහන් ප්‍රකාරය :—

සපයනු ලබන පාන් පරණ නොවිය යුතුයි. එමෙන් ම හරි හැටියට නොතැම්බුන ඒවා ද නොවිය යුතුයි. පාන් ගෙඩි වශයෙන් සැපයිය යුත්තේය. 1974.1.1 වැනි දින සිට සැපයීම් කළ යුතුය.

4. සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක බහා සීල් තබා නියමිත බන්ධනාගාර අධිකාරීන් වෙත ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවිය යුතුයි. එසේ තැපෑලෙන් නො යවනු ලබන ටෙන්ඩර් පත්‍ර නියමිත අධිකාරිතැනට හෝ ඔහු විසින් පත්කරනු ලබන බලය ලත් නියෝජිතයෙකු වෙත් නම් ඔහුට භාර දී ඒ භාරගත් බවට ලියවිල්ලක් ලබාගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරයේ වම් පැත්තේ, උඩ කෙළවරේ "1974 වර්ෂය තුළ ........................................................ ට පාන් සැපයීම සඳහා ටෙන්ඩරය" යැයි ලියා මෙහි 1 වැනි ඡේදයේ සඳහන් වේලාවට ප්‍රථම නියමිත අධිකාරිතැනට ලැබිය යුතු සේ එවිය යුතුයි.

6. ටෙන්ඩර් සඳහා නියමිත පෝර්ම ඒ ඒ ආයතන භාර අධිකාරීන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. නියමිත පෝර්මයේ ලියා නැති ටෙන්ඩරය භාරගනු නොලැබේ.

7. ටෙන්ඩර් පියවා මාස තුන (3) ක් යනතුරු, ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ ටෙන්ඩර් පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

8. ටෙන්ඩර්වල සියලුම වෙනස් කිරීම් හා මැකීම්වලට ටෙන්ඩර් කරුවන් විසින් තම කෙටි අත්සන යෙදිය යුතුයි.

9. මෙහි පහත සඳහන් පරිදි ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් කළ යුතු මුදල් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ (කොළඹ කච්චේරියේ හැර) වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කොට, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10 ක් ඇතුළත දී අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීමට නුපුළුවන් විනි නම්, හෝ එසේ කිරීමෙන් වැළැකී සිටි නම්, හෝ තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවා ඇත. ඉන්පසු රජය හා සම්බන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකි වන සේ ඔහුගේ නම කොන්ත්‍රාත්තු කඩකරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත. තවද, කොන්ත්‍රාත්තුව කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ වලංගු මුදලෙන් ඒ ඒ කොන්ත්‍රාත්තුවට තබා ඇති ඇප මුදලට සමාන මුදලක් රජය වෙනුවෙන්, බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම ටෙන්ඩර්කරුවනට සිදු වෙනවා ඇත. මෙම මුදල අලාභ වශයෙන් නීති මාර්ගයෙන් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස් වරයා වෙත පැවරී ඇත.

ටෙන්ඩර් පිළිගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙනු ලබන ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත් හෝ නො එසේව එහි ගෙන ගොස් භාරදුනහොත් හෝ එම නිවේදනය ටෙන්ඩර්කරුවා වෙත ලැබුණු ලෙස සලකනු ලැබේ. අන්‍ය සියලු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

උපලේඛනයේ සඳහන් පරිදි ඒ ඒ කොන්ත්‍රාත්තුව සඳහා වෙන් වෙන් වශයෙන් ඇප මුදල් තැන්පත් කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි සියලු ටෙන්ඩර් කරුවන්ගේ සැළකිල්ල යොමු කරවනු ලැබේ.

10. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන්, තම කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටු කරන බවට ඇපකරුවන් වශයෙන් ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට කැමැති වගකිව යුතු පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුයි. මෙම කොන්ත්‍රාත්තුව ගෙන යැමේදී කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

11. සේවාව නිසියාකාර ඉටු කිරීමේදී දතයුතු සියලුම අවශ්‍ය කරුණු උපලේඛනයෙහි සඳහන් අධිකාරීන්ගෙන් දැනගත හැක.

12. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස් වරයා සමග කොන්ත්‍රාත්තුවට අත්සන් තැබිය යුතුයි. එබඳු නිලධාරියෙකුගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේ ද, ගිණිය යුත්තේ ද ලංකාණ්ඩුව යටතේ දැනට එම පදවිය දරන්නා වූ නිලධාරියා ද ඔහුට පසුව එම පදවිය දරන්නා වූ නිලධාරියා ද වේ.

13. පුනරුත්ථාපන කඳවුරු පිළිබඳව, සැපයිය යුතු කාලසීමාව නම්, 1974.1.1 සිට 1974.12.31 දක්වා හෝ එයට පෙර කඳවුර වැසුවොත් එම දිනය දක්වාය.

**14. මෙයට පෙර රජයේ කොන්ත්‍රාත් ලබා නොමැති අයෙකු ටෙන්ඩර් පත් ඉල්ලීමේදී, එම ටෙන්ඩර් පත් නිකුත් කරන නිලධාරි තැනවෙත, තම ස්ථිර පදිංචි ලිපිනය හා නිශ්චල දේපොල විස්තර (වටිනාකම නොවේ) ඇතුලත්, ප්‍රදේශයේ ආදායම්පාලක නිලධාරි තැන විසින් සහතික කරනලද ලිපියක් ඉදිරිපත් කල යුතුය.**

ඒ. ඒ. ද සිල්වා,
වැ. බ. බන්ධනාගාර කොමසාරිස්.

**1973.9.18 දින,**
**කොළඹ බන්ධනාගාර මූලස්ථානයේ දීය.**

**උපලේඛණය**

| | බන්ධනාගාරය | | | | තැන්පත් මුදල (ටෙන්ඩර්) රු. | | ඇප මුදල රු. | | ටෙන්ඩර් භාරගන්නා නිලධාරි තැන |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | මීගමුව | ... | ... | ... | 50 | ... | 200 | ... | බන්ධනාගාර අධිකාරි, මීගමුව |
| 2. | අනුරාධපුරය | ... | ... | ... | 50 | ... | 200 | | |
| 3. | අනුරාධපුර පුනරුත්ථාපන කඳවුර | | ... | ... | 50 | ... | 200 | | බන්ධනාගාර අධිකාරි, අනුරාධපුරය |
| 4. | සේනපුර එම | ... | ... | ... | 50 | ... | 200 | | |
| 5. | බදුල්ල | ... | ... | ... | 50 | ... | 200 | | |
| 6. | තල්දෙන | ... | ... | ... | 50 | ... | 200 | | බන්ධනාගාර අධිකාරි, බදුල්ල |
| 7. | මහියංගනය පුනරුත්ථාපන කඳවුර | | ... | ... | 50 | ... | 200 | | |
| 8. | මඩකලපුව | ... | ... | ... | 50 | ... | 200 | ... | බන්ධනාගාර අධිකාරි, මඩකලපුව |
| 9. | මාතර | ... | ... | ... | 50 | ... | 200 | ... | බන්ධනාගාර අධිකාරි, මාතර |
| 10. | තංගල්ල | ... | ... | ... | 50 | ... | 200 | | |
| 11. | රිදියගම පුනරුත්ථාපන කඳවුර | | ... | ... | 50 | ... | 200 | | බන්ධනාගාර අධිකාරි, තංගල්ල |
| 12. | වීරවිල පුනරුත්ථාපන කඳවුර | | ... | ... | 50 | ... | 200 | | |
| 13. | කෝප්පායි | ... | ... | ... | 50 | ... | 100 | ... | බන්ධනාගාර අධිකාරි, යාපනය |
| 14. | කොග්ගල පුනරුත්ථාපන කඳවුර | | ... | ... | 50 | ... | 200 | ... | බන්ධනාගාර අධිකාරි, ගාල්ල |

9–744/3—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

**බන්ධනාගාර දෙපාර්තමේන්තුව**

**1974 මුදල් වර්ෂය තුළ දර සැපයීම**

1974 ජනවාරි මස 1 වෙනිද සිට 1974 දෙසැම්බර් මස 31 වෙනිද දක්වා බන්ධනාගාරවලට කැලෑ දර සපයා භාරදීම පිළිබඳව එම ආයතනයේ අධිකාරි විසින් 1973.10.15 වැනි දින පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

විස්තර මෙසේය :

සැපයීම පිළිබඳ විස්තර පහත සඳහන් අයුරු :—

විෂ්කම්භය අඟල් 3 කට නොඅඩුවූද, අඟල් 12 ට නොවැඩිවූද, දිග අඟල් 18 කට නොඅඩුවූද, අඟල් 36 කට නොවැඩිවූද, ඉතා හොඳට වියලුනු තද මේරූ ගැටවලින් තොරවූද, දර කැබලි එවලේම ප්‍රයෝජනයට ගැනීමට තරම් සුදුසු තත්ත්වයකට ඇති ඒවා විය යුතුයි. සපයනු ලබන දර ගොඩපර, දියපර, කටුකැරල්ල, මී, මිල්ල, හොර, සියඹලා, දවට, පලු, මිහිරිය, දන්, මොර, කුඹුක්, මූනමල් මාදන්, අලුබෝ ආදී තද ලී වර්ග වලට ඇතුළත් විය යුතුයි. හොණ්ඩරයකට රු. 14 දක්වා වූ ප්‍රමාණයකින් වියලීමට හා පොතු වලට අඩු කරනු ලැබේ.

එමෙන්ම කැප්ප්ද, ඇටඹ, රුක්අත්තන, ගැවලියා, සපු, අඹ, ඇල්බීසියා, මාර, කැකුණ, ඊරිය, හික්, මලබොඩ ආදී බුරුල් ලී වර්ග වලට අයත් දර භාරගනු නො ලැබේ.

2. බන්ධනාගාරවල හෝ කිට්ටු කච්චේරියක රු. 50 ක් තැන්පත් කිරීමෙන් ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අධිකාරින් ගෙන්, 1973.10.13 වෙනිද දහවල් 12 දක්වා දර සැපයීම සඳහා ආකෘති පත්‍ර ලබාගත හැක. එම ආකෘති පත් සමග අනුපිටපතක් ද එවිය යුතුයි. පහත සඳහන් ආයතනයන් සඳහා ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී ටෙන්ඩර් තැන්පත් මුදල් ඇවැසි නො වේ :—

(අ) සමුපකාර පොර වෙළඳ ආයතනය :
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ;
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ;
(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ත්‍රාර් විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

3. ටෙන්ඩර් පත්‍ර සීල් කරන ලද කවරයක බහා එහි වම් කෙළවරෙහි '' දර සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර '' යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. එම ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවනු නොලැබේ නම්, ටෙන්ඩර්කරු විසින් හෝ ඔහුගේ නියෝජිතයා විසින් බන්ධනාගාර ගේට්ටුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් විවෘත කරන දින නියමිත වේලාවට පෙර බහාලිය යුතුයි.

4. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් මිළ ගණන් අකුරෙන් හා ඉලක්කමින් ද විය යුතුයි. එසේ නොමැති ටෙන්ඩර් ප්‍රතික්ෂෙප වීමට ඉඩ ඇත.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට දන්වා යවා දින 10 ක් ඇතුළතදී බන්ධනාගාර අධිකාරි තැන සමග ඒ පිළිබඳ ගිවිසුමකට නොබැඳුන හොත් ඔහු විසින් තැන්පත් කළ ටෙන්ඩර් මුදල රාජසන්තක වීමට ද ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත් කඩකරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් වීමට ද ඉඩ ඇත.

6. හැම ටෙන්ඩරයක්ම 1973 ඔක්තෝබර් 15 වෙනි දින පෙරවරු 9.35 ට විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැක.

7. ටෙන්ඩර් භාරගත් අවසාන දින සිට මාස තුනක් යනතුරු ටෙන්ඩර්කරුවන් විසින් තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුය.

8. පුනරුත්ථාපන කඳවුරු සම්බන්ධයෙන්, දර සැපයිය යුතු කාලසීමාව වන්නේ, 1974.1.1 සිට 1974.12.31 දින දක්වා හෝ, කඳවුර එයට කලින් වැසුවහොත් එම දිනය දක්වා වේ.

9. මෙයට පෙර රජයේ කොන්ත්‍රාත් භාර නොගත් ටෙන්ඩර් කරුවන්, ටෙන්ඩර් ෆෝරම ඉල්ලා සිටීමේදී, තමන් පදිංචි පලාතේ ප්‍රාදේශිය ආදායම් පාලක නිලධාරි තැන විසින් සහතික කරනලද, තම ස්ථිර ලිපිනය හා නිශ්චල දේපල විස්තර ඇතුලත් ලිපියක් ටෙන්ඩර් ෆෝරම නිකුත් කරන නිලධාරියා වෙත ඉදිරිපත් කල යුතුයි.

ඒ. ඒ. ද සිල්වා,
වැඩ බලන බන්ධනාගාර කොමසාරිස්.

1973.9.18 දින,
කොළඹ බන්ධනාගාර මූලස්ථානය.

**උපලේඛණය**

| | බන්ධනාගාරය | | | | ඇප මුදල රු. | | ටෙන්ඩර් ෆෝරම ලබාගතයුතු නිලධාරි තැන |
|---|---|---|---|---|---|---|---|
| 1. | මහනුවර | ... | ... | ... | 350 | ... | බන්ධනාගාර අධිකාරි, මහනුවර |
| 2. | මීගමුව | ... | ... | ... | 200 | ... | එම මීගමුව |
| 3. | වතුපිටිවල | ... | ... | ... | 200 | ... | එම වතුපිටිවල |
| 4. | අනුරාධපුරය | ... | ... | ... | 200 | | |
| 5. | අනුරාධපුරය පුනරුත්ථාපන කඳවුර | | | ... | 200 | | බන්ධනාගාර අධිකාරි, අනුරාධපුරය |
| 6. | සේනපුර පුනරුත්ථාපන කඳවුර | | | ... | 200 | | |
| 7. | ප ලෙකැලේ සිර කඳවුර | | ... | ... | 350 | ... | බන්ධනාගාර අධිකාරි, පල්ලෙකැලේ |
| 8. | මහර | ... | ... | ... | 350 | ... | එම මහර |

9–744/4—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

### ඇලුමිනියම් පොලු සහ වානේ පොලු සහ තහඩු සැපයීම් සඳහා ටෙන්ඩර

පහත සඳහන් සැපයීම් සඳහා එක් එක් සැපයීම් ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

1. ඇලුමිනියම් පොලු—1973 නොවැම්බර් 5 දින.
2. වානේ පොලු සහ තහඩු—1973 නොවැම්බර් 28 දින.

එක් එක් ටෙන්ඩරය සඳහා රු. 100 ක ආපසු ලබා ගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා අවශ්‍ය ටෙන්ඩර් ෆෝර්ම මෙම කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල් එක් එක් ටෙන්ඩරය අවසන් වන දිනයන්ට කලින් වැඩ කරන දින දහවල් 12 න් පසු භාර ගනු නොලැබේ. අවලංගු කරන ලද ටෙන්ඩර් පත් පිටපතක් රු. 10 ක් ගෙවීමෙන් ලබා ගත හැක.

මිලට ගැනුම් කළමනාකාර.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670, 242, හැව්ලොක් පාර,
කොළඹ 5.

9-745 —73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

විසිතුරු තුල් ලබා ගැනීම සඳහා ඒවා නිපදවන්නන් සහ ඔවුන් ගේ නියෝජිතයින්ගෙන්, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973. 11. 08 වැනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් බාරගනු ලැබේ.

2. සම්පූර්ණ විස්තර සහ ටෙන්ඩර් පත් ලබා ගැනීම සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් විමසන්න.

යොමුව :—3/1-(2/18).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973. 09. 14

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

9-704 —73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ලණු පැදුරු වියීමේ යන්ත්‍රවලට පිඩෑස් සැපයීම සඳහා 1973. 11. 01 දින පෙ. ව. 10.00 වන තෙක් දේශීය නිෂ්පාදකයින්ගෙන් ටෙන්ඩර් බාරගනු ලැබේ.

2. සියලු විස්තර හා ටෙන්ඩර් කොන්දේසි කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත හැක.

යොමු අංකය :—3/1—(3/24).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973. 09. 14

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

9-705 —73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

### ජාතික කිරි මණ්ඩලය

#### යෝගට් සහ අයිස්ක්‍රීම් සඳහා අවශ්‍ය ප්ලාස්ටික්/ලී හැඳි සැපයීම සඳහා දේශීය ටෙන්ඩරය

නැවත ආපසු ලබාගත හැකි රු. 100 ක තැන්පත් මුදලක් හා ආපසු ලබාගත නොහැකි රු. 15 ක ටෙන්ඩර් ගාස්තුවක් ද, ගෙවීමෙන් ටෙන්ඩර් පත්‍රිකා නාරාහේන්පිට, කිරි මණ්ඩලීය කාර්යාලයේ සැපයුම් කළමනාකරුගෙන් ලබාගත හැක.

ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය සහ වේලාව.—1973 ඔක්තෝබර් මස 17 වෙනි බදාදා පෙ. ව. 10 දක්වා.

ටෙන්ඩර් පත් නිකුත් කරන අවසාන දිනය සහ වේලාව.—1973 ඔක්තෝබර් මස 16 වෙනි අඟහරුවාදා ප. ව. 3 දක්වා.

සභාපති,
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩල මූලස්ථානය,
නාරාහේන්පිට,
කොළඹ 5.

9-737—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා ධීවර සංස්ථාව

#### හිස් ගැලුමේ ටින් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

ඉහත සඳහන් වර්ගයේ ටින් 6200 ක් සැපයීම සඳහා ලංකා ධීවර සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 73. 10. 08 දින ප. ව. 2.30 දක්වා සිල් තබන ලද ටෙන්ඩර් භාරගනු ලැබේ.

රු. 50 ක ආපසු ගෙවනු ලබන තැන්පත් මුදලක් ගෙවීමෙන් පසු පහත අත්සන් තබන අයගෙන් 73. 10. 06 දින දහවල් 12 තෙක් ටෙන්ඩර් අයදුම් පත් ලබාගත හැක.

රොක්හවුස් පටුමග,
කොළඹ 15,
1973 සැප්තැම්බර් මස 18 වැනි දින.

කළමනාකාර සැපයීම් සහ ගබඩා.

9-764—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

26. (i) ප්‍රේෂණ ලාභියාට බඩු මිටි ඉතා ප්‍රවේසමින් පටවා ගෙන ගොස් නිවැරදිව භාරදීම තහවුරු කරනු වස්, භාර ගැනීම්, ඉවත් කර ගැනීම් හා පැටවීම් පිළිබඳ කොන්දේසිවල පිළිවෙත, නියමය හා උපදෙස් තදින්ම ටෙන්ඩර්කරුවන් විසින් පිළිපැදිය යුතුබව මනා ලෙස ඔවුන් මතක තබා ගත යුතුය.

(ii) ඒ ඒ ප්‍රේෂණ පත්‍ර ලැබුණු වහාම කාන්දුවී යෑම, දේශගුණ බලපෑම හා පරණවීයෑම් ආදී ඉඩ වැලැක්වීම පිණිසත්, පරිහාණියෙන් මුදා ගැනීම පිණිසත්, ඉතාමත් ප්‍රවේසම් වියයුතු බව තහවුරු කිරීම පිණිසත්, අත්‍යාවශ්‍ය බෙහෙත් බඩු බාහිරාදිය ගින්නට ක්ෂණිකව ගොදුරු විය හැකි බඩු බාහිරාදිය, වහා මළාණික විය හැකි ද්‍රව්‍ය යනාදිය ප්‍රවාහණය කිරීම උදෙසා සලස්වා තිබෙන නියමිත කාලවේලා එල්ලය ටෙන්ඩර්කරුවන් විසින් පිළිපැදිය යුතුව ඇත. එවැනි අවස්ථාවලදී පැය 24 ක් ඇතුළත ඒවා ඉවත්කර ගෙන යෑම තදින්ම පිළිපැදිය යුතුය. එවැනි ප්‍රේෂණ භාණ්ඩ ඔවුන් විසින් ප්‍රවාහණය කිරීමේ දී ඇතිවන ප්‍රමාද දෝෂයන් ගැන ටෙන්ඩර්කරුවන් පෞද්ගලිකවම වග කිව යුතු වෙයි.

(iii) එසේ බලය දෙනු ලැබූ ටෙන්ඩර්කරු විසින්, තමා විසින්ම, එක් එක් මිටිවල ලියාතිබෙන විස්තර හෝ ඊට අමුණා තිබෙන තුණ්ඩුවල විස්තර හෝ සමීක්ෂණය කොට ;

(අ) කැඩීබිඳීම් හෝ අවුස්සා තිබීම හෝ සොරකම් කිරීම හෝ යනාදී පිටස්තර ලකුණු කිසිවක් නැතිබවට සාක්ෂිවලින් ද,

(ආ) ප්‍රේෂණ පත්‍රවල දක්වෙන බර සමග බඩු මිටිවල බර සැසඳෙනවා ද,

(ඇ) බඩුමිටි බැඳ තිබුන ආකාරයටම තිබෙනවාද නැද්ද යන්නට සාධක වශයෙන් සුදුසු ලදු පතක් ලබා ගැනීමෙන් ද,

ඔහු විසින් සෑහීමකට පත්විය යුතුව ඇත.

27. **දක්විය යුතු මිළ ගණන්.**—(අ) (i) බඩු ඇදීම සඳහා මෙසේ වැටි 10 ක් යටතේ එක් එක් බර ගොල්ල වෙනුවෙන් මිළ ගණන්බී I—උපලේඛණයෙහි දක්විය යුතුය :—

බී I—උපලේඛනය

පළමුවැ රාත්තල් 28 දක්වාද,
දෙවැනුවැ රාත්තල් 28 ට වැඩියෙන් රාත්තල් 56 දක්වා ද,
තුන්වැනුවැ රාත්තල් 56 ට වැඩියෙන් රාත්තල් 84 දක්වාද,
සිව්වැනුවැ රාත්තල් 84 ට වැඩි හොණ්ඩර 1 දක්වාද,
පසුවැනුවැ හොණ්ඩර 1 ට වැඩියෙන් හොණ්ඩර $1\frac{1}{2}$ දක්වාද,
හයවැනුවැ හොණ්ඩර $1\frac{1}{2}$ ට වැඩියෙන් හොණ්ඩර 2 දක්වා ද,
හත්වැනුව හොණ්ඩර 2 ට වැඩියෙන් හොණ්ඩර $2\frac{1}{2}$ දක්වා ද,
අටවැනුවැ හොණ්ඩර 2 1/2 වැඩියෙන් හොණ්ඩර 3 දක්වා ද,
නමවැනුවැ හොණ්ඩර 3 ට වැඩියෙන් හොණ්ඩර $3\frac{1}{2}$ දක්වාද,
දහවැනුවැ හොණ්ඩර $3\frac{1}{2}$ ට වැඩියෙන් හොණ්ඩර 4 දක්වා ද වේ.

(ii) මුදල් ගෙවනු ලබන්නේ ඉතා වැඩි කොටසේ දක්වෙන මුලු දුර ප්‍රමාණය ම ගෙන යන ලද එක් එක් බඩු පොදි ගමන අනුවයි.

බී 1 හොණ්ඩර 4 ක් හෝ ඊට වැඩියෙන් හෝ බරක් ඇති බඩු තොග මුළු දුරම ගෙන යම සඳහා මතු සටහන් වැඩි 4 යටතේ බීII— උපලේඛණයෙහි මිළ ගණන් දක්විය යුතුයි.

බී II—උපලේඛනය

1. හොණ්ඩර 4 කට වැඩියෙන් හොණ්ඩර 10 දක්වා
2. හොණ්ඩර 10 කට වැඩියෙන් හොණ්ඩර 15 දක්වා
3. හොණ්ඩර 15 කට වැඩියෙන් ටොන් 1 දක්වා
4. ටොන් 1 කට වැඩියෙන්.

ටෙන්ඩර්කරුවන් විසින් මුළු දුරමැ ගෙනයෑම සඳහා ඒ ඒ වැඩ යටතේ මිළ ගණන් වෙන වෙනමැ දක්විය යුතුයි. මුදල් ගෙවනු ලබන්නේවැටි 4 යටතේ මුළු දුරම සඳහා හොණ්ඩරයකට දක්වූ මිළ ගණන මතු අනු ප්‍රමාණ ක්‍රමය උඩයි. හොණ්ඩරයක කොටසක් රාත්තල් 56 කට වැඩිනම් එය හොණ්ඩරයක් සේ සැලකෙයි. නොඑසේ නම් ඊට මුදලක් ගෙවනු නොලැබේ.

සී (i) එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට අඩුවේ නම් ඒවායේ ගෙවීම් බී I උප ලේඛණයේ යටතේ විය යුතුයි.

සී (ii) එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට වැඩිනම් ඒවායේ ගෙවීම් බී II උපලේඛණය යටතේ විය යුතුයි.

සී (iii) එක් බඩු තොගය යනුවෙන් මේ වගන්තියෙන් අදහස් වන්නේ දුම්රිය ස්ථානයේදී ඕනෑම දිනයක කොන්ත්‍රාත්කරුට බෙදහැරීම පිණිස භාරදෙන ලද මුලු බඩු ප්‍රමාණය හා ඕනෑම දිනයක දුම්රිය ස්ථානය වෙත ගෙන යෑම පිණිස ආයතනවලින් භාරදෙන ලද මුලු බඩු ප්‍රමාණයයි.

ඩී. සඳහන් කර ඇති මිළ ගණන් සාධාරණතා විය යුතු අතර යාබද බර කාණ්ඩ අතර අනවශ්‍ය පරිදි මිල වැඩිවිය යුතු නොවේ.

28. ගබඩා බඩු ප්‍රවාහනය පිළිබඳ ගෙවීම් සියල්ලම, වෙනත් දේ අතර, දුම්රිය බලධාරීන්ගෙන් ලබා ගත් සහතිකයක් මගින්ද තහවුරු කළ යුතුය.

29. මේ දැන්වීම, මෙහි පහත තබා ඇති තැනෙහි ටැන්ඩර්කරුගේ අත්සන තබා ටැන්ඩර් පත්‍රයත් සමග බදුල්ල සෞඛ්‍ය සේවා අධිකාරී වෙත ආපසු එවිය යුතුය.

දෙස්තර ඒ. සී. එස්. ජයසිංහ,
සෞඛ්‍ය සේවා අධිකාරී (නියෝජ්‍ය.)
බදුල්ල.

1973 සැප්තැම්බර් 8 වැනි දින.
බදුල්ල.

————.

නිකුත් කරන නිලධාරියාගේ අත්සන.

දිනය : 1972..............

————,

ටැන්ඩර්කරුගේ අත්සන.

දිනය : 1972..............

බදුල්ල සෞ.සේ/අධිකාරී කොටසේ 1974 ගබඩා බඩු ඇදීම සඳහා ටෙන්ඩර් කොන්දේසිවල 24 වන ඡේදයේ කියවෙන උපලේඛනය

1 වැනි කොටස

| දුම්රිය පොලෙන්/පොලට දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන්/ස්ථානයට | ආයතනවලින්/ආයතනවලට කාර්‍යාලවලින්/කාර්‍යාලවලට | | කිව්වුවෙන් සැළකිය හැකි දුර සැතපුම් |
|---|---|---|---|
| ඇල්ල ... ... | නමුනුකුල ම.බෙ.හ. | ... | 9 |
| | බිබිලේගම මා.නි. | ... | 14 |
| | හල්පේ ම.බෙ.හ. | ... | 3 |
| හාලිඇල ... | හාලිඇල ම.බෙ. ... | ... | 1 |
| | ඇටම්පිටිය ම.නි. | ... | 9 |
| | හලඋඩ ම.බෙ.හ. | ... | 15 |
| | තැන්නපංගුව ම.බෙ.හ. | ... | 17 |
| බදුල්ල ... | බදුල්ල ම.රෝ. ... | ... | 2 |
| | බදුල්ල සෞ.වෛ.නි.කා. | ... | 2 |
| | බදුල්ල සෞ.සේ.අධි.කා. | ... | 2 |
| | බදුල්ල ප්‍රා.බෙ.ග. | ... | 2 |
| | පස්සර රෝ. ... | ... | 12 |
| | පාසල් දන්ත වි. ... | ... | — |
| | පස්සර ම.ම. විදුහල | ... | 12 |
| | මැටිගස්තැන්න රෝ. | ... | 30 |
| | ලුණුගල රෝ. ... | ... | 26 |
| | බඩල්කුඹුර ග්‍රා.රෝ. | ... | 24 |
| | කහටරුප්ප ම.බෙ. | ... | 12 |
| | තල්දෙන ම.බෙ. | ... | 10 |
| | මීගහකිවුල රෝ. | ... | 15 |
| | කන්දකැටිය ග්‍රා.රෝ. | ... | 24 |
| | ඛැන්දගොල්ල ම.බෙ. | ... | 9 |
| | බද්දේගම ම.බෙ. | ... | 7 |
| | හිගුරු කඩුව මා.නි. | ... | 23 |
| හපුතලේ ... | හපුතලේ රෝ. ... | ... | $1\frac{1}{2}$ |
| | හල්දුම්මුල්ල ප.ඒ. | ... | 7 |
| | කොස්ලන්ද රෝ. | ... | 16 |
| | වල්හපුතැන්න ම.වි. දන්ත සායනය | | 9 |
| මොණරාගල ... | දඹගල්ල ම.බෙ.හ. | ... | 9 |
| | මොණරාගල දි.රෝ. | ... | $1\frac{1}{2}$ |
| | සියඹලාණ්ඩුව රෝ. | ... | 23 |
| | බුද්දම ම.බෙ.හ. ... | | 35 |
| | දෙඹගහවෙල ම.බෙ.හ. | ... | 12 |
| | මොණරාගල සෞ.වෛ.නි.කා. | ... | $1\frac{1}{2}$ |
| | දැලිව ම.බෙ.හ. ... | ... | 14 |
| | ඇතිමොලේ ම.බෙ.හ. | ... | 23 |
| | රත්මල්ගහඇල්ල ම.බෙ.හ. | ... | 65 |

| දුම්රිය පොලෙන්/පොලට දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන්/ස්ථානයට | | ආයතනවලින්/ආයතනවලට කාර්යාලවලින්/කාර්යාලවලට | | කිට්ටුවෙන් සැළකිය හැකි දුර සැතපුම් |
|---|---|---|---|---|
| වැලිමඩ | ... | බොරලන්ද ම.බෙ.හ. | ... | $7\frac{1}{2}$ |
| | | මීරහවත්ත ම.බෙ.හ. | ... | 5 |
| | | ඌවපරණගම ග්‍රා.රෝ. | ... | 5 |
| | | වැලිමඩ සෞ.වෛ.නි.කා. | ... | $\frac{1}{2}$ |
| | | වැලිමඩ දී. රෝ. | ... | $\frac{1}{2}$ |
| | | වැවේගම මා.නි. ... | ... | 15 |
| | | කැප්පෙට්ටිපොල ම.බෙ.හ. | ... | 6 |
| | | නැදුන්ගමුව ම.බෙ.හ. | ... | 7 |
| වැල්ලවාය | ... | හඳපාන්ගල ම.බෙ.හ. | ... | 6 |
| | | වැල්ලවාය ග්‍රා.රෝ. | ... | $\frac{1}{2}$ |
| | | හම්බෙගමුව මැ.බෙ.හ. | ... | 42 |
| | | බුත්තල දී. රෝ. | ... | 10 |
| | | තණමල්විල ග්‍රා.රෝ. | ... | 22 |
| බණ්ඩාරවෙල | ... | බණ්ඩාරවෙල දී.රෝ. | ... | 1 |
| | | බණ්ඩාරවෙල සෞ.වෛ. නි. | ... | $\frac{1}{2}$ |
| | | ලියන්ගහවෙල ම.බෙ.හ. | ... | 7 |
| දියතලාව | ... | දියතලාව දී.රෝ.... | ... | 1 |

III වැනි කොටස

| දුම්රිය පොලෙන්/පොලට දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන් ස්ථානයට | | ආයතනවලින්/ආයතනවලට කාර්යාලවලින්/කාර්යාලවලට | | කිට්ටුවෙන් සැළකිය හැකි දූර සැතපුම් |
|---|---|---|---|---|
| බිබිල ... | ... | මහඔය දී.රෝ. ... | ... | 20 |
| | | පදියතලාව ප.ඒ. | ... | 10 |
| | | බිබිල ප.ඒ. ... | ... | 1 |
| | | බිබිල සෞ.වෛ.නි.කා. | ... | 1 |
| | | ඌරණිය ග්‍රා.රෝ. | ... | 10 |
| | | ඇකිරියන්කුඹුර ම.බෙ.හ. | ... | 8 |
| | | දඹාන ම.බෙ.හ. | ... | 25 |
| | | මැදගම දී.රෝ. ... | ... | 10 |
| | | නන්නපුරාව ම.බෙ.හ. | ... | 7 |
| මහියංගනය | ... | මහියංගන දී.රෝ. | ... | 1 |
| | | මහියංගන ම.වි. දන්ත සායනය | ... | 1 |
| | | නාගදීප ම.බෙ.හ. | ... | 14 |

දෙස්තර ඒ. සී. එස්. ජයසිංහ,
බදුල්ල සෞඛ්‍ය සේවා අධිකාරී (නියෝජ්‍ය).

9–711—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

✓

**විශේෂ කොමසාරිස් කාර්යාලය—මොණරාගල නගරය**

පහත දක්වෙන උප ලේඛණයෙහි සඳහන් කර්මාන්තය සඳහා මෙම කාර්යාලයේ ලියාපදිංචි වූ හෝ රජයේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් සීල් තැබූ ටෙන්ඩර් 1973 ඔක්තෝබර් මස 09 වැනි දින පෙ.ව. 10 දක්වා මා විසින් භාර ගනු ලැබේ :—

2. ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීම 1973 ඔක්තෝබර් මස 06 වැනි දින පෙ.ව. 11 දක්වා කෙරේ.

3. ටෙන්ඩර් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ කර්මාන්තයේ නම සඳහන් කර අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මොණරාගල නගරයේ විශේෂ කොමසාරිස් සතුය. අදාළ කර්මාන්තය සඳහා වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළදී මෙම කාර්යාලයෙන් දැනගත හැක.

5. 1973 ඔක්තෝබර් මස 09 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලබන අතර එම වේලාවට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට ඉඩ දෙනු ලැබේ.

**උපලේඛනය**

| කර්මාන්තයේ නම | | ටෙන්ඩර් තැන්පත් රු. ශ. | | පෝර්ම ගාස්තු රු. ශ. |
|---|---|---|---|---|
| 1. මොණරාගල පොල භූමිය දියුණු කිරීම පළමුවෙනි පියවර | ... ... ... | 100 0 | ... | 10 0 |

වී. සී. වර්සකෝන්,
විශේෂ කොමසාරිස්,
මොණරාගල නගරය.

1973 සැප්තැම්බර් මස 11 වෙනි දින,
මොණරාගල, විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී.

9–773—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

# බඩුබාහිරාදිය විකිණීම්

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ—දැව වෙන්දේසිය—බස්නාහිර දිසාව**

තොග 6 කින් යුක්ත මිල්ල, පෙලෙන්, අඟුරුමිරිය, තිත්ත ඇට, නාඉඹුල්, කටමඳ, හොර, අඳුන්වැන්න, කඳන් සහ ඉරූ දැව ඝන අඩි 396.3 ක් ද තොග 8 කින් යුත් දිග කියත් 1 ක් ද, ඇලි තූල් 1 ක් ද, අඩි කෝදු 2 ක් ද, ඉල්ලන් කූරු 1 ක් ද, ගැල්වනයිස් බාල්දි 1 ක් සහ පොරෝ 5 ක් ද බස්නාහිර දිසා වන නිලධාරි විසින් 1973.10.1 දින පෙරවරු 9.00 ට දෙහිඔවිට අඩවි වන කාර්යාල යේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියට පෙර මෙම දැව සහ භාණ්ඩ බලා පැහීමකට පත් වන ලෙස ඉල්ලුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. වෙන්දේසිය පිළිබඳ වැඩිදුර විස්තර රත්නපුර දිසා වන නිලධාරීගෙන් හෝ දෙහිඔවිට අඩවි වන නිලධාරීගෙන් ලබා ගත හැක.

එච්. ආර්. පීරිස්,
දිසාවන නිලධාරි—බටහිර දිසාව.

දිසාවන කාර්යාලය,
රත්නපුර.

9–734—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

## රේගුවේ වෙන්දේසිය

පහත දැක්වෙන භාණ්ඩ 1973 ඔක්තෝබර් මස 05 වන දින කොළඹ, ශ්‍රී ලංකා රේගුවේ ගමන් බඩු කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. පෙ. ව. 9ට වෙන්දේසිය ආරම්භ වෙයි. 1973 ඔක්තෝබර් මස 04 වන දින පෙ. ව. 9.30 සිට දවල් 12 දක්වාත් ප. ව. 1 සිට ප. ව. 3 දක්වාත් භාණ්ඩ ප්‍රදර්ශනය සඳහා තබනු ඇත :—

1. තරංගමාලා 3 ට්‍රාන්සිස්ටර් 13—මොඩල් අංක ඇස් ජී 765 වර්ගයට අයත් විදුලි හා බැටරි බලයෙන් ක්‍රියාකරන නැෂනල් රේඩියෝ ෆෝනෝග්‍රාෆ් එකක්.
2. ඒ 77—1224—අංක එස්. 015364 " රි ඩෝක් " වර්ගයට අයත් උසස් ක්‍රියාකාරීත්වයෙන් යුත් ටේප් රෙකෝඩරයක්.
3. මැණික්ගල් 17—දිය කාන්දු නොවන රෝමර් වර්ගයේ පාවිච්චි කළ පිරිමි ඔර්ලෝසුවක්.
4. මල නොබැඳෙන. කාන්දමට නොඇදෙන, දිය කාන්දු නොවන ස්විට්සර්ලන්තයේ නිෂ්පාදිත " ඇටෝන් " වර්ගයට අයත් පාවිච්චි කළ පිරිමි ඔර්ලෝසු එකක්.
5. කාන්දමට නොඇදෙන දිය කාන්දු නොවන. ස්විට්සර්ලන්තයේ නිෂ්පාදිත, සුපර් ඩිලුක්ස් 707—පාවිච්චි කළ කැප්ටන් ඔර්ලෝසු එකක්.
6. තුවරි 7ක්.
7. තර රහිත උල්පත් පෑන් 63ක්.
8. ගල්කුරු පෙට්ටි 1ක්.
9. නයිලෝන් ලනු පන්දු 12ක්.
10. එකක් 12 බැගින් වූ " අයිඩීස් " නයනාලේප පැකට් 12ක්.
11. තල රහිත උල්පත් පෑන් 81ක්.
12. එකක් යාර 100 දිග දම්වැල බැගින් වූ " ටයිගර් " වර්ගයට අයත් දම්වැල් පැකට් 5 ක්.
13. කෘත්‍රිම පබලු පැකට් 2 ක්.
14. කෝපි කුඩු පැකට් 1ක්.
15. උපැස් යුගල 10ක් හා අව්කාන්නාඩි 1ක්.
16. පොට්ටු පැකට් 2ක්.
17. එකක 10 බැගින්වූ වෝල්ට් 2.05 බලැති "දිනමනී" වර්ගයට අයත් විදුලි පන්දම් බුබුලු පැකට් 200ක්.
18. ටිඩිකේ—සී 60 කැසට් ටේප් 6ක් "බීඒඇස්ඇෆ්".
    ටිඩිකේ—සී 90 කැසට් 19ක් " බීඒඇස්ඇෆ් "
19. ටිරල් වර්ගයට අයත් 12½×1.75×2¼ ටයර් 3 ක් ටියුබ් සමග
20. " මොලිනෙක් " වර්ගයට අයත් ක්‍රෝස් වියලනයක්.
21. " සැන්ටෙක්ස් " කෝ. 80 ඇම්. වර්ගයේ අතේ ගෙනයනහැකි විදුලි එකතුකරන යන්ත්‍රයක්.
22. නත්තල් සැරසිලි බුබුලු කට්ටල 2 ක්.
23. කලැන්ඩර් 13ක්—දිනපොතක්—මේස කැලැන්ඩරයක්.
24. ' රේන්බෝ " වර්ගයට අයත් අලවන කඩදාසි මිටියක්.
25. වින්චෙස්ටර් විදුලි පන්දම්—බැටරි 5 එකක්—බැටරි 3 එකක් සහ බැටරි 2 එකක්.
26. " බීඒඇස්ඇෆ්" සී 90 කැසට් ටේප් 6ක්.
27. සිට 28 දක්වා "සීකෝ" ගමන් සීනු ඔර්ලෝසු 2ක්.
29. " බූටාන් " වර්ගයට අයත් සිගරට් ලයිටර් 6ක් ගෑස් ටියුබ් 6ක් සමග.
30. " සීකෝ " ට්‍රාන්සිස්ටර් බිත්ති ඔර්ලෝසු එකක්.
31. වයර් සහ ප්ලග් පෙට්ටි එකක්.
32. ඔස්ට්‍රියාවේ නිපයු සිගරට් ලයිටර් ගිනිගල් පැකට් 25 ක්.
33. 'මෝලිනෙක්ස්' කෙස් වියලනයක්.
34. ' මොලිනෙක්ස් ' ඇඹරුම් හා මිශ්‍ර කරන උපකරණයක්.
35. එකක 10 බැගින් වූ යතුරු ලියන මකන කැලි පෙට්ටි 2ක්.
36. සීක්වින්ස් අවුන්ස 30ක් අඩංගු ගමන් මල්ලක්.
37. සිට 40 දක්වා ; සික්වින්ස් වැඩ දමූ කාන්තා ඇඳුම් හතරක්.
41. සීක්වින්ස් සහ පබලු වැඩ දැමූ කාන්තා ඇඳුමක්.
42. රාත්තල් 19½ක් අඩංගු සික්වින් පැකට් 1ක්—රා. 18, අවු. 7 අඩංගු සීක්වින්ස් පාර්සල් 1ක්.
43. රාත්තල් 10ක් පමණ වූ සීක්වින්ස් පැකට් 43ක්.
44. කෆ්ලින්ක් ජෝඩු 27ක්.
45. එකක් 12 බැගින් වූ ලෝහ දම්වැල් පැකට් 12 ක්.
46. විදුලි මාර්ග පිරික්සුම් උපකරණ 36ක්.
47. කුඩා කතුරු 24ක්.
48. ඔවල්ටින් 1ක් සැවන් සීස් මෝරතෙල් ගුලි 500ක් අඩංගු බෝතල් 1ක්.
49. සැකරින් ටින් 1ක්.
50. බැටරි 3 වින්චෙස්ටර් විදුලි පන්දම් 1ක්.
51. ගෝයා සබන් කැලි 12ක්, ලක්ස් සබන් කැලි 8ක්.
52. කරාබු නැටි රාත්තල් 8½ක්.
53. පළුදු වූ කමිස 8ක්.
54. පාවිච්චි කරනලද රැකොඩ් 20ක්.
55. රාත්තල් 4ක් පමණ බර ඇති සීක්වින්ස් පැකට් 2ක්.
56. රිදී ආලේපිත කෝප්ප හා බන්දේසි කට්ටලයක්.
57. නිකල් ආලේපිත කෆ්ලින්ක්ස් ජෝඩු 24ක් සහ රන් ආලේපිත කෆ්ලින්ක්ස් ජෝඩු 72ක්.
58. අත්ඔර්ලෝසු කොටස් පැකට් 2ක්,—බෝල සහ ඉස්කුරුප්පු.
59. රාත්තල් 7½ පමණ බරැති සික්වින්ස් පාර්සලයක් සමග ගමන් මල්ලක්.
60. " ක්වික් කියෝ " ටියුබ් වෝල්කනයිස් කොම්පවුන්ඩ් පැකට් 12ක්.
61. ළමා සුවඳ විලවුන් කට්ටලයක්.
62. ටීඇල් සුපර්—" යෂිකා " කැමරා එකක්—ඇග්පා 151 ෆ්ලෑෂ් උපකරණය සමග.
63. බීඒඇස්ඇෆ්—සී 90 කැසට් ටේප් 100ක්.
64. සිට 69 දක්වා ; " සීකෝ " ගමන් සීනු ඔර්ලෝසු 6ක්.
70. ආගස්/කැසිනෝ—මොඩල් අංක 706—චලන සේයා කැමරා 1ක්.
71. " ස්ටාර් " වර්ගයේ මල නොබඳින—ඉන්ජෙක්ෂන් ඉඳිකටු පැකට් එකක් (කටු 12).
72. එකක රාත්තල් ½ බැගින් වූ පැකට් අඩංගු තේ රාත්තල් 59½ ක්.
73. රාත්තල් 86ක් පමණ බරැති, සික්වින්ස් පැකට් 86ක් (රන් පාට 72—රිදීපාට 14).
74. ඒන්ජල් වර්ගයට අයත් කඩදාසි කුට්ටම් 42ක්.
75. මේපල් ලීෆ් වර්ගයට අයත් චුයින්ගම් පැකට් 20ක් සූචිකෝසය සමග.
76 සිට 77 දක්වා උණුවතුර බෝතල් 2ක්.
78. එකක 20—200 බැගින් වූ " බ්ලැක් ඇන්ඩ් වයිට් " ඩිලුක් පිල්ටර් සිගරට් කාටුන 3ක්.
79. " කෝශවර්ධනී " වර්ගයේ කෝශාලේප බෝතල් 24ක් කුඩා සුවඳ විලවුන් බෝතල් 18ක්.
80. අනුකරණීය ස්වර්ණාභරණ—විවිධ වර්ගයේ පැකට් 13ක් අඩංගු පැකට් 1ක්.
81. සිට 82 දක්වා ; සෙරෙප්පු ජෝඩු දෙකක්.
83 සිට 84 දක්වා ; වේට්ටි 2ක්.
85 සිට 88 දක්වා ; කපු සාලු 4ක්.
89. අලි කැටයම් අළුබඳුන් 6ක්.
90. අලි 4ක්. කළුවර ලීයෙන් නිමවූ.
91. පොත් රඳවනයක් සමග කළුවර ලීයෙන් නිමවූ අලි 12ක්.
92. බෙර එකක්—පොල්කටු ඉබ්බෙක්, අලිමත නැංවූ පොල්කටු බඳුනක්—හිස් ස්වර්ණාභරණ පෙට්ටියක් සහ පසුම්බි දෙකක්.
93. ඉන්දියානු " මුල්දින කවර " 441ක්.
94. ට්‍රන්ක් 1ක්—කරඳමුංගු කාටුන 1ක්—රාත්තල් 130 පමණ බරැති.
95. පිත්තල සරනේරු 147ක්.
96. සැන්ඩල් වුඩ් සබන් කලි 89ක්.

2. ඒ ඒ බඩු වෙන්දේසිකර හමාරවූ වහාම භාරගත් ලංසුවට ගැනෙන මුදල සම්පූර්ණයෙන්ම ගෙවූවිට බඩු ඉවත්කරගෙන යාමට දෙනු ලැබේ.

3. කොළඹ ශ්‍රී ලංකා රේගුවේ ගාස්තු නිලධාරියාගෙන් වැඩිමනත් විස්තර ලබාගත හැක.

ජී. ඒ. ද සොයිසා,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

බිඹ/73/ඔක්තෝබර්, වෙන්දේසිය.
1973 සැප්තැම්බර් මස 13 වන දින,
කොළඹ 1,, ශ්‍රී ලංකා රේගුවේදී ය.

9-667—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

**ප්‍රසිද්ධ වෙන්දේසිය**

**ප්‍රධාන මහෙස්ත්‍රාත් උසාවිය—කොළඹ**

**මෙම උසාවියේ නඩු වලට ඉදිරිපත් කළ අයිතිකරුවන් විසින්** ඉවත් කර ගෙන නැති සහ රාජසන්තක කරන ලද භාණ්ඩ තොගයක් 1973 ඔක්තෝබර් මස 20 වෙනි දින පස්වරු 12.30 ට උසාවි භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බවට මහජනයාට මෙයින් දනුම් දෙමි.

එදින දවල් 12 සිට එම භාණ්ඩ බලා ගැනීමට ඉඩ සලසනු ලැබේ. විකිණීමට නියමිත භාණ්ඩවල සම්පූර්ණ ලැයිස්තුවක් වෙන්දේසි දිනට සතියකට පෙර උසාවි දැන්වීම් පුවරුවේ පලකරනු ඇත.

ජී. ඩී. ජී. ද අල්විස්,
ප්‍රධාන මහෙස්ත්‍රාත්.

1973 සැප්තැම්බර් 13 වන දින,
කොළඹ, ප්‍රධාන මහෙස්ත්‍රාත් උසාවියේ දීය.

9-688—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : සිඩී/11/67

**ප්‍රසිද්ධ වෙන්දේසියක්**

**කොළඹ රෝහල් මණ්ඩලය**

පාවිච්චියට නුසුදුසු පහත සඳහන් භාණ්ඩ කොළඹ රෝහල් මණ්ඩලයට අයිති රෝහල්වලදී සහ අනිකුත් ඒකකයන්හිදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

**1. කොළඹ කාසල් වීදියේ කාන්තා රෝහලේදී :**

වෙන්දේසිකරන දිනය :—1973 ඔක්තෝබර් මස 22 දින උදේ 9 ට.

**භාණ්ඩ විස්තර :—**

(1) ලාම්පුවක් (පැට්‍රෝල් මැක්ස්) 1 (එකයි)
(2) ලාම්පුවක් (පැට්‍රෝල් මැක්ස් ගෑස්) 1 (එකයි)
(3) උදුනක් (ලාම්පුතෙල්) 1 (එකයි)
(4) කේතල (විදුලිබලයෙන් ක්‍රියා කරන) 2 (දෙකයි)
(5) හොට් ප්ලේට් ( එම ) 4 (හතරයි)
(6) විදුලි ගෙබිම මදින 3 (තුනයි)
(7) ගිලන්රථ බෙල් 1 (එකයි)
(8) ගිලන්රථ ෆෑන් 2 (දෙකයි)
(9) ටයිම්පීස් ඔර්ලෝසු 3 (තුනයි)
(10) ඩෙවෝන් ටික් මෙට්ට සමග ඇඳන් 1 (එකයි)
(11) ලන්තෑරුම් 17 (දාහතයි)
(12) ලොරි ටයර් 650 × 20 3 (තුනයි)

**2. රාගම පුනරුත්ථාපන රෝහලේදී :**

වෙන්දේසිකරන දිනය :—1973 ඔක්තෝබර් මස 26 වැනි දින උදේ 9 ට

**භාණ්ඩ විස්තර :—**

(1) ඩෝල්ටන් ෆිල්ටර්ස් 2 (දෙකයි)
(2) විදුලි හොට් ප්ලේට් 11 (එකොලහයි)
(3) පොත් රාක්ක 2 (දෙකයි)
(4) රෝහල් ස්ථාම (කබඩ් සමග) 10 (දහයයි)
(5) කැරම් බෝඩ් 2 (දෙකයි)
(6) කෑම මේස 1 (එකයි)
(7) බෙත් බාස්කට් 1 (එකයි)
(8) රෙදි දාන වෙවැල් කූඩ 1 (එකයි)
(9) මීට් සේප්සු 2 (දෙකයි)
(10) වයර් පාපිසි 7 (හතයි)
(11) ඉන්පෙලේටර් 1 (එකයි)
(12) වතුර වත්කරන පෝච්චි 1 (එකයි)
(13) පිල්ටර් ස්ටෑන්ඩ් 2 (දෙකයි)
(14) තේක්ක ස්ක්‍රීන් 1 (එකයි)
(15) සාමාන්‍ය පුටු 8 (අටයි)
(16) පියන් ස්ටූල් 2 (දෙකයි)
(17) කතුරු (මහන) 1 (එකයි )
(18) කතුරු (කුඩා) 1 (එකයි)
(19) පොරව 1 (එකයි)
(20) ඩී.ඩී.ටී. ස්ප්‍රේයර් 2 (දෙකයි)
(21) ජයිල් භාජ් රවුන්ඩ් 1 (එකයි)

**3. මහරගම රජයේ පිළිකායතනයේදී :—**

වෙන්දේසිකරන දිනය :—1973 ඔක්තෝබර් මස 29 දින උදේ 9 ට

**භාණ්ඩ විස්තර :—**

(1 කැරම්බෝඩ් 1 (එකයි)
(2) මොනරා පාපැදියක් (ඒ. 3574) කොටස් වෙන්කළ) 1 (එකයි)
(3) මිනී කරත්ත (අත්කරත්ත) 1 (එකයි)
(4) මිට සමඟ ජැක් 1 (එකයි)
(5) වෑන් බැටරි එන්.ආර්. 200491 (12 වෝල්ටීස්) 1 (එකයි)
(6) වෑන් බැටරි එම්.සී. 412 (12 වෝල්ටීස්) ඌෂා 1 (එකයි)

**4. අංගොඩ උණ රෝහලේදී :**

වෙන්දේසිකරන දිනය :—1973 ඔක්තෝබර් මස 30 දින උදේ 9 ට.

**භාණ්ඩ විස්තර :—**

(1) ලොකු අල්මාරි 1 (එකයි)
(2) රෝහල් ස්ථාන කබඩ් සමග 2 (දෙකයි)
(3) රෙදිපෙට්ටි 1 (එකයි)
(4) රෝහල් ස්ථාන 4 (හතරයි)
(5) ඉණිමග 1 (එකයි)
(6) ළමා ඇඳන් 1 (එකයි)
(7) හුලන් ගහන පොම්පයක් 1 (එකයි)
(8) පරීක්ෂණ විදුලි ලාම්පුවක් 1 (එකයි)
(9) භාන්සිපුටු (ලොන්ච්) 1 (එකයි)
(10) කුඩා මේස 1 (එකයි)
(11) ලී ඇඳන් 42 (හතළිස් දෙකයි)
(12) ලී කණු 2 (දෙකයි)
(13) විල් බැරෝ 1 (එකයි)

**5. කොළඹ මහරෝහලේ ගබඩා අංශයේදී :**

වෙන්දේසිකරන දිනය :—1973 ඔක්තෝබර් මස 31 දින උදේ 9 ට

**භාණ්ඩ විස්තර :—**

(1) මෝටර් රථ ටියුබ 700 × 20 2 (දෙකයි)
(2) මෝටර් රථ ටියුබ 640 × 15 4 (හතරයි)
(3) මෝටර් රථ ටියුබ 650 × 18 2 (දෙකයි)
(4) මොටර් රථ ටයර් 640 × 15 2 (දෙකයි)
(5) මෝටර් රථ ටයර් 670 × 15 1 (එකයි)
(6) මෝටර් රථ ටයර් 650 × 18 3 (තුනයි)
(7) මේස පංකා (ඉංග්‍රීසි) 1 (එකයි)
(8) මේස පංකා (ජර්මන්) 1 (එකයි)
(9) මෝටර් රථ බැටරි (එක්සයිඩ්) 2 (දෙකයි)
(10) බිත්ති ඔර්ලෝසු (ජර්මන් විදුලි) 1 (එකයි)
(11) අයිස් පෙට්ටි (ඉලෙක්ට්‍රෝලැක්ස්) 1 (එකයි)
(12) රලේ පාපැදි 1 (එකයි)
(13) ඉංග්‍රීසි යතුරු ලියන 1 (එකයි)
(14) ඇඳි බංකු 1 (එකයි)
(15) මෝටර් රථ ටියුබ 670 × 15 1 (එකයි)
(16) මෝටර් රථ ටියුබ 750 × 20 3 (තුනයි)

**6. 124, ඊ. ඩබ්ලිව්.පෙරේරා මාවත, කොළඹ 10, රෝහල් නඩත්තු අංශයේදී**

වෙන්දේසි කරන දිනය :—1973 ඔක්තෝබර් මස 19 දින උදේ 9 ට

**භාණ්ඩ විස්තර :—**

(1) ජී.අයි. පයිප්ප 31.2" දිග අඩි 625½
(2) ජී. අයි. පයිප්ප 42.1½" දිග අඩි 705½
(3) ජී. අයි. පයිප්ප 52.1¼" දිග අඩි 679
(4) ජී. අයි. පයිප්ප 61.1" දිග අඩි 580½
(5) ජී. අයි. පයිප්ප 71.¾ දිග අඩි 639½
(6) ජී. අයි. පයිප්ප 80.½" දිග අඩි 4
(7) 89 ජී. අයි. ටැන්ක්ස් ගැලොම් 400 25
(8) 95 ජී. අයි. ටැන්ක්ස් විවිධ ප්‍රමාණ 4

1. ජයග්‍රාහක ලන්සුකරු විසින් වෙන්දේසිය අවසානයේදී මුළු මුදල ගෙවා එම ද්‍රව්‍යයන් ඉවතට ගෙන යා යුතුය.

2. මෙම වෙන්දේසිය අවලංගු කිරීමට හෝ කල් දැමීමට හෝ ඕනෑම ලන්සුවක් ප්‍රතික්ෂේප කිරීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනට බලය තිබේ.

3. වෙන්දේසි කිරීමට පෙර දින උදේ 9 සිට පස්වරු 2 දක්වා මෙම භාණ්ඩ ඉහත සඳහන් ස්ථානවලදී පරීක්ෂා කර බැලිය හැක.

4. වැඩි විස්තර ආයතන භාර නිලධාරීන්ගෙන් විමසා දනගැනීමට පුළුවන.

එස්. ඩී. එම්. ප්‍රනාන්දු,
කොළඹ රෝහල් මණ්ඩලයේ
අධිකාරී.

1973.9.14 වැනි දින,
කොළඹ මහරෝහලේ මාණ්ඩලික අධිකාරී
කාර්යාලයේදීය.

9-689—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

# වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම්

## අනුරාධපුරේ ප්‍රසිද්ධ වෙන්දේසියක්

අනුරාධපුරේ දිස්ත්‍රික් උසාවියේ දීය

කුඩානෙලුබැවේ පදිංචි කපුරුහාමි ලේකම්ගේ අවුසදහාමි සෝමරත්න ........................................................ පැමිණිලිකරු.

නො : 6986. එදිරිව

නුවරගම් කෝරලේ රත්මලේ පදිංචිව සිට නැසීගිය ඒ. ඇම්. පීටර් සිංඤෝගේ බූදලය භාරකාරී වන වී. ඇම්. සිරිමාවතී...... ........................................................................ විත්තිකාරී.

අනුරාධපුර දිසා අධිකරණයේ අංක 6986 උගස් නඩුවේ වර්ෂ 1970 ජූනි මස 29 වෙනි දින දී තිබෙන නඩු තීන්දුව යටතේ එම නඩුවේ විත්තිකාරිගෙන් රුපියල් හත්දහක් (7,000) ද, 1970 ජූනි මස 29 වෙනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා අවසාන වනතුරු නීත්‍යානුකූල පොලියත් සමගද නඩු ගාස්තුවද (තවම ගණන් බේරා කර නැත) අය කර ගැනීම සඳහා මා වෙත නිකුත් කරන ලද බලය කරණ කොට ගෙන 1973 ඔක්තෝබර් මස 27 වෙනි සෙනසුරාදා පෙරවරු 11 ට මෙහි පහත සඳහන් දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

එනම් : උතුරු මධ්‍යම දිසාවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ බස්නාහිර නුවරගම් පලාතේ නුවරගම් කෝරලේ රත්මලේ තුලානේ කිරිමැටියාවේද මහනෙළුබැවේද කුඩානෙළුබැවේද යන ගම්වල පිහිටි කිරිමැටියාව මූකලාන මහනෙලුබැව කැලේ සහ කුඩානෙලුබැව කැලේ යන නම් ඇති 1957 අගෝස්තු මස 20 වෙනි දින සී. ජේ. සභාපති බලයලත් මිනින්දෝරු තැන විසින් සාදා දී තිබෙන නොම්මර 1475 දරණ ප්ලෑන් කඩදාසියේ සඳහන් ටී. පී. නොම්මර 01309 යන මුල් සිතියමේ සඳහන් ලොට් නොම්මර 25 දරණ ඉඩමෙන් ලොට් නොම්මර 3 දරණ ඉඩමට මායිම් :—උතුරට ඉහතකී නොම්මර 1475 දරණ ප්ලෑනේ ලොට් නොම්මර 2 දරණ ඉඩමද, නැගෙනහිරට ලොට් නොම්මර 13 දරණ ඉඩමද, දකුණට ඉහතකී නොම්මර 1475 දරණ ප්ලෑනේ ලොට් නොම්මර 4 දරණ ඉඩමද, බස්නාහිරට නොම්මර LP 2489 දරණ බිදු බල පත්‍රයේ සඳහන් ඉඩමද යන මායිම් තුල අක්කර 15 ක ඉඩම (අක්. 15 රූ. 0 ප. 0) අනුරාධපුර ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ නොම්මර ඒ 169 කොටසේ 216 වැනි පිටේ ලියාපදිංචි කර ඇත.

ඔප්පු විමසීම : අනුරාධපුරේ පෙරකදෝරු සහ නොතාරිස් ඇස්. නඩරාජා මහතාගෙන් විමසන්න.

ඩී. ජී. විජයවර්ධන,
උසාවියේ කොමසාරිස් සහ වෙන්දේසිකරු.

බසවක්කුලම,
අනුරාධපුර,
1973 සැප්තැම්බර් මස 1 වෙනි දින දී ය.

9-606—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

**සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.**

**ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වනවාත් හැර එය සියළු දෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.**

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දැන්වීම් මුදල් භාර නොගනී. සියළුම දැන්වීම් මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.**

### උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ඔක්තෝබර් | ... | 5.10.73 | සිකුරාද | ... | 25. 9.73 | අඟහරුවාද | දහවල් | 12.00 |
| | | 12.10.73 | සිකුරාද | ... | 3.10.73 | බදාදා | දහවල් | 12.00 |
| | | 19.10.73 | සිකුරාද | ... | 10.10.73 | බදාදා | දහවල් | 12.00 |
| | | 26.10.73 | සිකුරාද | ... | 17.10.73 | බදාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | ... | 2.11.73 | සිකුරාද | ... | 24.10.73 | බදාදා | දහවල් | 12.00 |
| | | 9.11.73 | සිකුරාද | ... | 31.10.73 | බදාදා | දහවල් | 12.00 |
| | | 16.11.73 | සිකුරාද | ... | 7.11.73 | බදාදා | දහවල් | 12.00 |
| | | 23.11.73 | සිකුරාද | ... | 14.11.73 | බදාදා | දහවල් | 12.00 |
| | | 30.11.73 | සිකුරාද | ... | 21.11.73 | බදාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | ... | 7.12.73 | සිකුරාද | ... | 28.11.73 | බදාදා | දහවල් | 12.00 |
| | | 14.12.73 | සිකුරාද | ... | 5.12.73 | බදාදා | දහවල් | 12.00 |
| | | 21.12.73 | සිකුරාද | ... | 12.12.73 | බදාදා | දහවල් | 12.00 |
| | | 28.12.73 | සිකුරාද | ... | 19.12.73 | බදාදා | දහවල් | 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1973 අගෝස්තු මස 18 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.